## 1. යෙදවුමෙහි විෂය පථය

### 1.1 විෂය පථය

මෙම සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසි (මින්මතු "සාමාන්‍ය කොන්දේසි" වශයෙන් හඳුන්වනු ලබන) නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. (මින්මතු "බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන) සහ එහි අනුප්‍රාප්තිකයින් සහ පැවරුම්ලාභීන් (ගිවිසුම්, හුවමාරු කිරීම්, විකල්ප සහ ඕනෑම ව්‍යුත්පන්න ගනුදෙනු ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී) සමග ගනුදෙනකරුගේ ගිණුම්, ගනුදෙනු අවස්ථා, ගනුදෙනු සහ ව්‍යාපාරික සබඳතාවලට අදාළ විය යුතු අතර ඒවා පාලනය කළ යුතු වන්නේය.

### 1.2 සංශෝධන

මෙහි අඩංගු වන නියමයන් සහ කොන්දේසි බැංකුව විසින් තම අභිමතය පරිදි ගනුදෙනුකරුට සිදු කරන දැනුම්දීමක් සමග විටින් විට සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම සිදු කළ හැකිය.

## 2. ගිණුම් පවත්වා ගැනීම

### 2.1. වාරාන්තර ශේෂ ප්‍රකාශයන්

#### 2.1.1 වාරාන්තර ශේෂ ප්‍රකාශයන් නිකුත් කිරීම

අන්‍යාකාරයකින් එකඟ වී නොමැත්තේ නම් බැංකුව විසින් තීරණය කරනු ලබන යම් කාල පරාසයන්හි දී ක්‍රියාකාරී තත්වයේ පවතින ගනුදෙනුකරුගේ ගිණුම (ගිණුම්) සඳහා වාරාන්තර ශේෂ ප්‍රකාශයන් (කඩදාසිමය හෝ විද්‍යුත් ආකාරයෙන්) බැංකුව විසින් නිකුත් කරනු ඇත.

#### 2.1.2 විරෝධතා සඳහා ඉඩ ලබා දෙන කාලය

ගනුදෙනුකරුට ලැබෙන වාරාන්තර ශේෂ ප්‍රකාශයක අසත්‍ය බව හෝ අසම්පූර්ණ බව සම්බන්ධයෙන් ගනුදෙනුකරුට ඇති වන ඕනෑම විරෝධතාවක් කඩිනමින් මතු කළ යුතු නමුත් එය ප්‍රකාශය නිකුත් කළ දින සිට දින තිහක් (30) ඇතුළත බැංකුවට ලිඛිතව ලැබිය යුතුය.

ඉහත නිශ්චිතව දක්වා ඇති කාල සීමාව තුළ කිසිදු විරෝධතාවයක් නොමැත්තේ නම් වාරාන්තර ප්‍රකාශය නිවැරදි සහ ගනුදෙනුකරු මත බැඳී පවතින බවට සැළකිය යුතු වන්නේ ය.

#### 2.1.3 ප්‍රකාශයන්හි පිටපත්

ඔහුගේ/ඇයගේ ප්‍රකාශයන් හි පිටපත් ආරක්ෂා කර තබා ගැනීමේ වගකීම ගනුදෙනුකරු සතු වේ. ප්‍රකාශයන් හි කඩදාසි පිටපත් බැංකුවෙන් ඉල්ලා සිටියහොත්, බැංකුව විසින් ප්‍රකාශිත අයකිරීම්වලට අනුකූලව එවැනි අතිරේක පිටපත් සඳහා ගාස්තු අය කිරීමට අයිතිය බැංකුව සතු වේ.

### 2.2 බැංකුව විසින් සටහන් ආපසු හැරවීම් සහ නිවැරදි කිරීම් සිදු කිරීම

ඕනෑම ගිණුමක නිවැරදි නොවන සටහන් මීළඟ වාරාන්තර ශේෂ ප්‍රකාශය නිකුත් කිරීමට හෝ පාස්පොත් යාවත්කාලීන" කිරීමට පෙර හෝ ඉන්පසුව බැංකුව විසින් වැඩිදුර සටහනක් ("සටහන ආපසු හැරවුම " ) මාර්ගයෙන් ආපසු හැරවීම, නිවැරදි කිරීම හෝ අවලංගු කිරීම සිදුකළ හැකි වේ. එවැනි ආපසු හැරවුමක් හෝ නිවැරදි කිරීමක් හෝ අවලංගු කිරීමක් පිළිබඳව බැංකුව අහිසි ප්‍රමාදයකින් තොරව ගනුදෙනුකරුට දැනුම් දෙනු ඇත. පොලිය ගණනය කිරීමට (හෝ වෙනත් ප්‍රතිලාභ) සම්බන්ධ ඕනෑම නිවැරදි කිරීමක් සම්බන්ධයෙන් තමන්ට සුදුසු යැයි හැගෙන ආකාරයට නිවැරදි කිරීම සිදු කිරීමට බැංකුව සිය අභිමතය රඳවා තබා ගනී.

### 2.3 අයිරාගත කරනු ලැබූ ප්‍රමාණයන්

බැංකුව තම අභිමතය පරිදි (එසේ කටයුතු කිරීමට බැඳී සිටීමකින් තොරව) ගනුදෙනුකරුගේ කිසියම් ගෙවීමක් සපුරාලීම සඳහා හෝ කිසියම් උපදෙස් ක්‍රියාත්මක කිරීම සඳහා ගනුදෙනුකරු වෙත ණය ලබා දීම, මූල්‍ය පහසුකම් ලබා දීම හෝ අත්තිකාරම් මුදල් ලබා දීම සිදු කළ හැකි අතර එවන් විටක දී ඊට අදාළව ඒ අනුව උද්ගත වන්නා වූ ගනුදෙනුකරුගේ කිසියම් සහ සියලු වගකීම්;

- (i) බැංකුවේ ඉල්ලීම මත (වෙනත් ආකාරයකින් බැංකුවට ලිඛිතව එකඟ වී නොමැත්තේ නම් මිස) ගනුදෙනුකරු විසින් ආපසු ගෙවිය යුතු අතර
- (ii) එවැනි අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ යම් අනුපාතයකට හෝ එවැනි ගිවිසුමක් නොමැත්තේ නම් බැංකුව එහි අභ්‍යන්තර ක්‍රියා පටිපාටීන්ට අනුකූලව සාධාරණ ලෙස තීරණය කරනු ලැබිය හැකි යම් අනුපාතයකට පොලිය දැරිය යුතු වන්නේ ය.

### 2.4 ගිණුම්වල අනවසර ගනුදෙනු හෝ ණය සාධනපතක් සම්බන්ධ වංචාවක් සම්බන්ධයෙන් පාර්ශවයන්ගේ වගකීම

අනවසර ගනුදෙනුවක් සිදුවුවහොත්, වහාම බැංකුව හා සම්බන්ධ වන ලෙස ගනුදෙනුකරුට උපදෙස් දෙනු ලැබේ.
සැක සහිත හෝ සාමාන්‍ය නොවන ලෙස පෙනෙන ගනුදෙනු අවහිර කිරීමට බැංකුවට අයිතිය ඇත.
සැක සහිත වංචාවක් සිදුවුවහොත්, එවැනි සැකයක වලංගුභාවය තීරණය කිරීම සඳහා බැංකුව විසින් පරීක්ෂණයක් පවත්වනු ඇත. ගනුදෙනු වාර්තා සමාලෝචනය කිරීම, ආරක්ෂිත දර්ශන විශ්ලේෂණය කිරීම සහ අදාළ තොරතුරු රැස් කිරීම සඳහා ගනුදෙනුකරු සමඟ සන්නිවේදනය කිරීම මෙයට ඇතුළත් විය හැකිය.

## 2.5 එකතු කර ගැනීමේ නියෝග

### 2.5.1. ලේඛන ඉදිරිපත් කිරීම මත සිදු කළ කොන්දේසි සහිත බැර සටහන්

ගෙවන බැංකුව හෝ වෙනත් ආයතනයක් විසින් ගෙවීම් කිරීමට ප්‍රථමයෙන් චෙක්පත්, අනෙක් සාධන පත්‍රවල සහ සෘජු හර කිරීම්වල කවුන්ටර වටිනාකම ගනුදෙනුකරුට බැර කරනු ලබන්නේ නම් මෙම අයිතමයන් සඳහා බැංකුව විසින් ම ගෙවනු ලබන්නේ වුවද, ඒවා සම්පූර්ණයෙන් ම  නියමිත වේලාවට බැංකුව වෙත ගෙවීමේ කොන්දේසිය මත පමණක්  එය සිදු කරනු ඇත.

ඉහත කී පරිදි එවැනි චෙක්පත්, සාධන පත්‍ර, අයිතමයන් හෝ සෘජු හර කිරීම් බැංකුව වෙත නොගෙවන්නේ නම් හෝ ලබා ගැනීමේ නියෝගය යටතේ එම මුදල බැංකුව ලබා නොගන්නේ නම්, ඒ අතරතුර වාරාන්තර ශේෂ ප්‍රකාශයක් නිකුත් කර ඇත්තේ ද නැද්ද යන්න නොසලකා හරිමින්, ගනුදෙනුකරුගේ ඕනෑම ගිණුමක (පොළිය සහ වියදම් ඇතුළුව) කොන්දේසිගත බැර සටහන් අවලංගු කිරීමට සහ/හෝ හර කිරීමට බැංකුව හිමිකම් ලබනු ඇත.

### 2.5.2. ගනුදෙනුකරු විසින් සිදු කරන ලද සෘජු හර කිරීම් සහ චෙක්පත් ගෙවීම

බැංකුවේ සාමාන්‍ය ක්‍රියා පටිපාටියට අනුකූලව හර සටහන අවලංගු කර නොමැත්තේ නම් සෘජු හර කිරීම් සහ චෙක්පත්වලට ගෙවනු ලැබේ.

## 2.6 විදේශ මුදල් ගිණුම් සහ ගනුදෙනුවල දී අන්තර්ගත අවදානම

පහත දැක්වෙන සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට ලබා දෙන හෝ සිදු කරනු ලබන රෙගුලාසි, නියෝග, මාර්ගෝපදේශ සහ අනෙකුත් මෙහෙයුම් උපදෙස් වලට යටත්ව, බැංකුවේ විවෘත කර පවත්වාගෙන යනු ලබන සියලුම විදේශ මුදල් ගිණුම් පාලනය කළ යුතු වන්නේ ය.

### 2.6.1. විදේශ මුදල් ගිණුම්

අ.) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද මුදල් ඒකක භාවිතා කරමින් තනි පුද්ගලයන් හෝ ආයතන විසින්  විදේශ මුදල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යා හැක.

ආ) බැංකුව විසින් එවැනි ඕනෑම ගිණුමක් සම්බන්ධයෙන් අවම මූලික තැන්පතුවක් නිශ්චිතව දක්වනු ඇත.

ඇ) බැංකුව විදේශ මුදල් ගිණුම් කාර්යයන් සඳහා භාර පිළි නොගනී.

ඈ) ගිණුමේ හර කිරීම සඳහා විදේශ මුදල් නෝට්ටු නිකුත් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් අදාළ අධිකාරියක් විසින් කලින් කලට ක්‍රියාත්මක කරන්නා වූ මෙහෙයුම් උපදෙස් වලට යටත් වනු ඇත. ගිණුමේ පවත්වාගෙන යන විදේශ මුදල් වෙනුවට විදේශ මුදල් නෝට්ටු පිරිනැමීමට බැංකුව කිසිදු අවස්ථාවක බැඳී නොසිටී. කෙසේ වෙතත්, බැංකුව එවැනි නෝට්ටු ගනුදෙනුකරුට පිරිනමන්නේ නම්, පවතින වෙළඳපල මිල ගණන් යටතේ එය සිදු කරනු ඇත.

### 2.6.2 තැන්පතු

අ) විදේශ මුදල් නෝට්ටු එම මුදලේ ඒකකය ම භාවිතා වන ගිණුමකට හෝ ගනුදෙනුකරුගේ වෙනත් විදේශ මුදල් ගිණුමකට තැන්පත් කිරීම ඒ ඒ සාධන පත්‍රය සහ ඒ ඒ මුදල් යුගල සඳහා පවතින විනිමය අනුපාතවලට යටත් වේ.

ආ) බැංකුව මත නිකුත් නොකරන ලද අණකර සහ අනෙකුත් ගෙවීම් ඇණවුම් මිලදී ගත යුතුද නැතහොත් එකතු කිරීම සඳහා යවන්නේද යන්න බැංකුවට සිය අභිමතය පරිදි තීරණය කළ හැකිය. ගෙවන බැංකුව විසින් පසුව  අගරු කරනු ලැබුවහොත්, මිලදී ගන්නා සියලුම සාධන පත්‍ර සම්බන්ධයෙන් පූර්ණ උපයෝජනය (ගාස්තු ඇතුළුව) බැංකුව විසින් රඳවා තබා ගනු ඇත. අගරු කිරීම පිළිබඳ දැනුම්දීම ලැබීම මත ගනුදෙනුකරුගේ ගිණුම හර කරනු ලැබේ.

ඇ) බැංකුව මත නිකුත් කරන ලද අණකර ඕනෑම ගිණුමක බැර කිරීමට ගෙවනු ලබන විට, බැංකුව විසින් එහි ප්‍රකාශිත අය ක්‍රමයට අනුකූලව හැසිරවීමේ ගාස්තු අඩු කරනු ඇත. එවැනි තැන්පතු මත වටිනාකම් දිනය බැංකුවේ පවතින ප්‍රතිපත්තිය මත පදනම්ව බැංකුව විසින් තීරණය කරනු ඇත. ගිණුමක් බැර කිරීම සඳහා බැංකුව මත නිකුත් නොකරන ලද අණකර/චෙක්පත්/අනෙකුත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර මිලදී ගත් විට, ගිණුමට බැර කිරීමේදී එම සාධන පත්‍රයේ මුහුණත වටිනාකමින් හැසිරවීමේ ගාස්තුවලට  අමතරව බැංකුව වට්ටම් ගාස්තු අඩු කරයි.

### 2.6.3. ප්‍රේෂණ

අ) ප්‍රේෂණයක්/අණකරයක් සම්පූර්ණයෙන්ම අයදුම්කරුගේ අවදානම මත යැවිය යුතුය.

ආ) ප්‍රේෂණවල නිශ්චිතව දක්වා ඇති පරිදි හෝ බැංකුව විසින් සද්භාවයෙන් තීරණය කර ඇති පරිදි  අරමුදල්වල සුදුසු වටිනාකමක් ලැබුණු දිනයේ හෝ ඉන් අනතුරුව එළඹෙන දිනක දී එම ලැබුණු මුදල් අදාළ මිලදී ගැනීමේ අනුපාතයට අනුව අදාළ ප්‍රතිලාභී මුදල් බවට පරිවර්තනය කරනු ඇත. බැංකුවට තම අභිමතය පරිදි එවැනි පරිවර්තනයකදිනය තීරණය කළ හැකි වේ.

ඇ) ප්‍රේෂණ අවලංගු කිරීමේදී, ආපසු ගෙවීමක් කළ යුත්තේ ප්‍රේෂණ ලැබීමේ දී සහ මුදල් ආපසු ලබා දෙන අවස්ථාවේ දී විනිමය අනුපාතවල වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නියෝජිත බැංකුවෙන් සත්‍ය වශයෙන්ම ලද මුදල මත පමණි.  බැංකුව විසින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි අදාළ මිලදී ගැනීමේ සහ විකිණීමේ අනුපාත අදාළ කර ගැනීමට බැංකුවට හැකි අතර එසේ කරන ලද වියදම් සහ එහි අනුග්‍රාහකයන් හෝ නියෝජිතයන් විසින් අය කරනු ලබන ඕනෑම ගාස්තුවක් සඳහා ප්‍රතිපූරණය කර ගැනීමට අයිතිය ඇත්තේ ය. එකතු කරන ලද සියලුම අවලංගු කිරීමේ ගාස්තු, අයකිරීම් සහ කොමිස් මුදල් ආපසු ගෙවිය නොහැක.

ඈ) මුදල් ප්‍රේෂණය කිරීමේදී සහ අවලංගු කිරීමේදී හෝ ආපසු හරවා යැවීමේ දී ඇතිවන විනිමය අනුපාතවල වෙනස සම්බන්ධයෙන් බැංකුව වගකිව යුතු නොවේ. එවැනි අවලංගු කිරීම හෝ ආපසු හැරවීම නිසා  කිසියම් අලාභයක් සිදුවුවහොත්, ගනුදෙනුකරු විසින් එය ද දැරිය යුතු වන්නේ ය. එවැනි අවලංගු කිරීම් නිසා ඇතිවන වාසි ගනුදෙනුකරුට ලබා නොදෙනු ඇත.

ඉ) ගෙවීම ප්‍රමාද වීම හෝ ගෙවීමට උපදෙස් ලබා දීමේ දී ප්‍රමාද වීම, සංක්‍රමණයේදී හෝ අන්‍යාකාරයකින් අයිතමයන් අහිමි වීම, විකෘති කිරීම , නොකර හැරීමේ දෝෂය, බාධා කිරීම් හෝ කිසියම් අයිතමයක්, ලිපියක්, ටෙලෙක්ස්, විදුලි පණිවුඩයක්  සම්ප්‍රේෂණය කිරීම හෝ භාරදීම ප්‍රමාද වීම හෝ බැංකුවේ අනුගාහකයන්ගේ හෝ නියෝජිතයින්ගේ ක්‍රියාවන් හේතුවෙන් සිදුවන විදේශ මුදල් හුවමාරු පාඩු හෝ වෙනත් පාඩු හෝ හානි සඳහා බැංකුව වගකිව යුතු නොවේ.

### 2.6.4. ගනුදෙනුකරුගේ අවදානම

විදේශ මුදල් ගනුදෙනුවලට බැංකුව වගකිව යුතු නොවන විදේශ විනිමය අවදානම් ඇතුළත් විය හැකි බවට වන පූර්ණ  අවබෝධයෙන් යුතුව ගනුදෙනුකරු සෑම විදේශ මුදල් ගනුදෙනුවකටම ඇතුළු විය යුතුය.

කිසියම් විදේශ මුදල් ගනුදෙනුවක් අවලංගු කිරීමකදී, එවැනි අවලංගු කිරීමක්  නිසා ඇතිවන ඕනෑම අලාභයක් ගනුදෙනුකරු විසින් ආරෝපණයකරනු ලබන අතර, එවැනි අවලංගු කිරීම් හේතුවෙන් ලැබෙන කිසිදු ලාභයක් ගනුදෙනුකරු වෙත නොපැවරවේ.

## 3. ගනුදෙනුකරුගේ යුතුකම්

### 3.1 නියෝග/උපදෙස් වල පැහැදිලිතාව

ඕනෑම ආකාරයක නියෝග/උපදෙස්වල අන්තර්ගතය කාලෝචිත, පැහැදිලි සහ නිසැක විය යුතුය. උපදෙස්වල සංශෝධන, සනාථ කිරීම් හෝ පුනරාවර්තන, එලෙසින් ම සඳහන් කළ යුත වන්නේය.

### 3.2 නියෝග/උපදෙස් ක්‍රියාත්මක කිරීම සම්බන්ධිත හදිසි අවශ්‍යතා සඳහා විශේෂ නිර්දේශය

ගනුදෙනුකරුවෙකුට නියෝගයක්/උපදෙසක් විශේෂයෙන්ම ක්ෂණිකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නම් (උදා. යම් දිනයක දී ආදායකයාගේ ගිණුමට මුදල් පැවරුවක් බැර කළ යුතු බැවින්), ගනුදෙනුකරු විසින් මෙම අවශ්‍යතාවය වෙනම බැංකුවට දැනුම් දිය යුතු වන්නේ ය.

### 3.3 බැංකුවෙන් ලැබුණු දැනුම්දීම් පරීක්ෂා කිරීම සහ විරෝධතා

ගනුදෙනුකරු ගිණුම් ප්‍රකාශ (2.1 ඡේදය මගින් පාලනය වන්නා වූ වාරාන්තර ශේෂ ප්‍රකාශය හැර) ගනුදෙනු ප්‍රකාශ, සුරැකුම් සහ ආයෝජන ආදායම් පිළිබඳ ප්‍රකාශ, අනෙකුත් ප්‍රකාශ, ඇණවුම්/උපදෙස් ක්‍රියාත්මක කිරීමේ උපදෙස් සහ අපේක්ෂිත ගෙවීම් සහ භාණ්ඩ තොග පිළිබඳව වන තොරතුරුවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය පරීක්ෂා කර ඕනෑම විරෝධතාවයක් සම්බන්ධයෙන් ලිඛිතව බැංකුව වෙත වහාම දැනුම් දිය යුතු අතර ඉහත දක්වා ඇති ආකාරයට කිසිදු විරෝධතාවක් නොමැති නම්, ඉහත සඳහන් කළ ප්‍රකාශයන්, උපදෙස් සහ තොරතුරු නිවැරදි සහ ගනුදෙනුකරු වෙත බැඳී පවතින ලෙස සැලකිය යුතු වන්නේ ය.

### 3.4 ප්‍රකාශයන් නොලැබුණ විට බැංකුව වෙත දැනුම් දීම

2.1.1 ඡේදයේ සඳහන් යම් වාරාන්තර ශේෂ ප්‍රකාශයක් සහ/හෝ වෙනත් ප්‍රකාශයක් හෝ උපදේශයක් හෝ තොරතුරක් ලැබී නොමැත්තේ නම් ගනුදෙනුකරු විසින් වහාම බැංකුව වෙත ඒ බව ලිඛිතව දැනුම් දිය යුතු වන්නේ ය.

## 4. බැංකු සේවා පිරිවැය

### 4.1 පොලිය, ගාස්තු සහ ණය වූ වියදම්

#### 4.1.1. පොලී සහ ගාස්තු

අ. ගනුදෙනුකරු විසින් යම් අනුපාතයකට (අනුපාතවලට) අනුව, යම් පදනමක් මත යම් අවස්ථාවක දී බැංකුවට ගෙවිය යුතු මුදල් මත පොලිය ගෙවිය යුතු අතර, කලින් කලට බැංකුව සමඟ ඊට ලිඛිතව එකඟ විය යුතු වන්නේ ය.

ආ. ගෙවන ලෙස ඉල්ලා සිටි විට ගනුදෙනුකරු වහාම බැංකුව වෙත ගෙවීම හෝ ප්‍රතිපූරණය කළ යුතු අතර, ගනුදෙනුකරු වෙත කලින් දැනුම් දීම් සිදු කර තිබුණ ද නොතිබුණ ද, බැංකුව විසින් ගනුදෙනුකරු සමඟ සිදු කරන ලද ඕනෑම ගනුදෙනුවක් සම්බන්ධයෙන් නෛතික වියදම් ඇතුළුව බැංකුව විසින් දරනු ලබන සියලුම පිරිවැය, ගාස්තු, ණය සහ අනෙකුත් වියදම් ගනුදෙනුකරුගේ ඕනෑම ගිණුමකට (ගිණුම්වලට) හර කිරීමට බැංකුවට හිමිකම් ඇත.

ඇ. ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු වන්නා වූ බැංකුවේ පොලී අනුපාත, ගාස්තු, අය කිරීම් සහ කොමිස් මුදල් පිළිබඳ තොරතුරු බැංකුවේ අය ක්‍රමය දැක්වෙන පත්‍රිකාවේ අඩංගු වන අතර එය ගනුදෙනුකරුවන්ට අදාළ වන ඕනෑම විශේෂ ප්‍රතිලාභයන් ද සමඟින් ආයතනික වෙබ් අඩවියේ දක්වා ඇත.

#### 4.1.2. ගණනය කිරීමේ ක්‍රමය

බැංකුවේ පොලී ගණනය කිරීමේ සූත්‍රය පහත පරිදි වේ.

ගණනය කිරීම, බැංකුවේ සියලුම වත්කම් සහ වගකීම් නිපැයුම් වලට සංගත වන්නේ ය. ගනුදෙනුකරුට සිදු කරන දැනුම් දීමක් සමඟ මෙම සූත්‍රය බැංකුව විසින් කලින් කලට වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම සිදු කළ හැකිය.

ශේෂ පදනම "පොලී අනුපාතය/100" පොලී පදනම.
පොලී පදනම මුදල් ඒකක මත රඳා පවතී. උදාහරණයක් ලෙස ශ්‍රී.ලං .රු . තථ්‍ය/තථ්‍ය වේ. එ .ජ .ඩො තථ්‍ය/360 වේ.

#### 4.1.3. අයවීමට ඇති හිඟ මුදල් සඳහා පොලිය

අයවීමට හිඟව නියමිත කාලයේ දී නොගෙවූ මුදල් හෝ පූර්ව එකඟතාවයකින් තොරව අයිරාගත කරන ලද මුදල් සඳහා වැඩි පොලී අනුපාතයක් අය කිරීමට බැංකුවට එහි අභිමතය පරිදි හිමිකම් ඇති අතර එම පොලිය බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි වරින් වර සංයුක්ත කළ හැකි වේ.

#### 4.1.4. විචල්‍ය පොලී අනුපාතය

විචල්‍ය පොලී අනුපාත ණය සම්බන්ධයෙන්, අදාළ ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව පොලී අනුපාතිකය ගලපනු ඇත. අන්‍යාකාරයකින් ලිඛිතව එකඟ නොවන්නේ නම් මිස, සේවාවන් සඳහා වන අය කිරීම් බැංකුව විසින් දැනුම්දීමක් සහිතව වෙනස් කළ හැකි වේ.

#### 4.1.5 බදු සහ අනෙකුත් අයබදු

බැංකුව විසින් ගනුදෙනුකරු සමග සිදු කරන ගනුදෙනු සඳහා ගෙවිය යුතු වන්නා වූ රජය විසින් පනවා ඇති සියළු අදාළ වන බදු, තීරුබදු සහ අනෙකුත් අයකිරීම් සම්බන්ධයෙන් බැංකුවට ප්‍රතිපූරණය කිරීමට ගනුදෙනුකරු බැඳී සිටී.

## 5. සුරැකුම්

### 5.1 සුරැකුම් ඉල්ලා සිටීමට බැංකුවට ඇති අයිතිය

බැංකුව වෙත ගනුදෙනුකරුගේ (පවතින, ඉදිරි, කල් නොපිරුණු, කොන්දේසි සහිත හෝ අවිනිශ්චිත) ඕනෑම වගකීමක් සඳහා සුරැකුම් ගනුදෙනුකරු විසින් ඉදිරිපත් කිරීම අවශ්‍ය යැයි හැගෙන ඕනෑම අවස්ථාවක එලෙස ඉල්ලා සිටීමේ අයිතිය බැංකුව විසින් රඳවා තබා ගනී.

2

### 5.2 සුරැකුම උපලබ්ධිවීම

ගනුදෙනුකරු කිසියම් මුදලක් ගෙවීමට හෝ මුදල් ආවරණයක් හෝ සුරැකුමක් සැපයීමට අපොහොසත් වන්නේ නම් හෝ නොසපයන්නේ නම්, එවිට ගනුදෙනුකරු විසින් බැංකුවට තිබිය යුතු කිසියම් අවිනිශ්චිත හෝ වෙනත් බැඳීමක් හෝ වගකීමක් ඇත්ත වශයෙන්ම කල් පිරී තිබුණ ද නොතිබුණ ද බැංකුව විසින් ගනුදෙනුකරුට දැනුම් දීමක් සහිතව සිය පරම අභිමතය පරිදි සුදුසු යැයි හැගෙන ආකාරයට සහ යම් කොන්දේසි මත ගනුදෙනුකරුගේ ඕනෑම වත්කමක් විකිණීම, උපලබ්ධි කර ගැනීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම (ඕනෑම මුදල් පරිවර්තනයක් සිදු කිරීම ඇතුළුව) කළ හැකිය. ගනුදෙනුකරුගේ වත්කම් විකිණීම, උපලබ්ධි කර ගැනීම හෝ බැහැර කිරීමේදී දරනු ලබන සියලුම ගාස්තු ගනුදෙනුකරු විසින් දැරිය යුතු වන්නේ ය. ඉහත සඳහන් විකිණීමේ හෝ බැහැර කිරීමේ බලය ක්‍රියාත්මක කිරීමේදී සිදුවිය හැකි යම් අලාභයක් සම්බන්ධයෙන් බැංකුව හෝ එහි නියෝජිතයන් කිසිඳු ආකාරයකින් වගකිව යුතු නොවන අතර එවැනි විකිණීම හෝ බැහැර කිරීම සම්බන්ධයෙන් බැංකුව විසින් සේවයේ යොදවා ඇති කිසියම් තැරැව්කරුවෙකුගේ, වෙන්දේසිකරුවෙකුගේ, නියෝජිතයෙකුගේ හෝ වෙනත් පුද්ගලයෙකුගේ ක්‍රියාවන් හෝ පැහැර හැරීම සම්බන්ධයෙන් බැංකුව

වගකිව යුතු නොවන්නේ ය.

කිසියම් විකිණීමකින් හෝ බැහැර කිරීමකින් , ඊට අදාළ සියලු වියදම්, ගාස්තු සහ අනෙකුත් ගෙවීම් සහ ඕනෑම පූර්ව හිමිකම් පෑම් ගෙවීමෙන් අනතුරුව ලැබෙන ශුද්ධ ආදායම , ගනුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතු හෝ ගෙවීමට ඇති බවට පත්වන්නා වූ මුදල් ගෙවීම සඳහා යෙදිය යුතු වන්නේ ය.

විකිණීමේ හෝ බැහැර කිරීමේ බලය ක්‍රියාත්මක කළ හැකි බවට බැංකුවේ ඕනෑම නිලධාරියෙකු විසින් කරන ලද ප්‍රකාශයක් එවැනි කරුණක් සඳහා තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

**6. ලියම සහ හිලව් කිරීම**

**6.1 ලියම සහ හිලව් කිරීම පිළිබඳ ගිවිසුම**

**6.1.1. ලියම**
බැංකුව සන්තකයට පැමිණ ඇති හෝ පැමිණිය හැකි ගනුදෙනුකරුගේ ඕනෑම සුරැකුම්පතක් සහ දේපලක් මත බැංකුව විසින් ලියමක් සහ/හෝ සුරැකුම් අයිතියක් අත්කර ගන්නා බවට ගනුදෙනුකරු සහ බැංකුව එකඟ වන්නේ ය.

**6.1.2. හිලව් කිරීමේ අයිතිය**
ගනුදෙනුකරු වෙත බැංකුව විසින් ලබා දුන් හෝ ලබා දීමට නියමිත ණය මුදල්, ණයවර, අත්තිකාරම් හෝ වෙනත් මූල්‍ය ආධාර, අනුග්‍රහයන් සහ බැංකු පහසුකම් මත බැංකුව වෙත දැනට හෝ මින්මතු ගෙවීමට හිඟව ණයව හෝ ගෙවිය යුතුව ඇත්තා වූ හෝ ගෙවිය යුතු බවට පත් වන්නා වූ සියලුම මුදල් ද බැංකුව වෙත ගනුදෙනුකරුගේ ඇති සියළු ණයගැතිභාවයන් සහ වගකීම් ද ඕනෑම ආකාරයක සහ ස්වභාවයක ස්ථාවර තැන්පතු ගිණුම්, ඉතුරුම් ගිණුම්, ජංගම ගිණුම්, තැන්පතු සහතික හෝ වෙනත් ඕනෑම ගිණුමක්, තැන්පතුවක් හෝ ගනුදෙනුවක් මත ගනුදෙනුකරුගේ බැරට දැනට පවතින හෝ මින් මතු පවතින්නා වූ හෝ බැංකුව විසින් ගනුදෙනුකරුට ගෙවීමට හිඟව ණයව සහ ගෙවිය යුතු බවට පත්වන්නා වූ සියලුම මුදල් ඕනෑම විටක සහ මින්මතු සියල් කල්හි ම හිලව් කර ගැනීමට සහ අදාළ කර ගැනීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත සිය කැමැත්ත පළ කර බලය පවරනු ලබයි.මෙහි සඳහන් එම කාර්යය සඳහා බැංකුවට අවශ්‍ය වන ආකාරයට එවැනි ක්‍රියාවක් කිරීමට හෝ එවැනි ලේඛනවලට අත්සන් කිරීමට ගනුදෙනුකරු පොරොන්දු වන්නේ ය.

**6.1.3. අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීම**
බැංකුවට ගෙවිය යුතු ඕනෑම මුදලක් ගෙවීම සඳහා ගනුදෙනුකරු වෙත දැනුම් දීමක් සහිතව මෙයින් නිර්මාණය කරන ලද හිලව් කිරීමේ හෝ උකසේ හෝ අදාළ කර ගැනීමේ අයිතිය ක්‍රියාත්මක කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත බලය පවරයි.

**7. ජංගම ගිණුම්**

ජංගම ගිණුම් ශේෂයන් මත කිසිදු පොලියක් සඳහා ඉඩ නොමැත.

චෙක්පත් පොත් නාමික ගාස්තුවකට සපයනු ලබන අතර වෙනත් කිසිදු ආකාරයකින් සිදු කිරීමට ඉල්ලා සිටින ආපසු ලබා ගැනීමේ ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව විසින් රඳවා තබා ගනී.

චෙක්පත් භාවිතා කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස ගනුදෙනුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

අ) ගනුදෙනුකරු වෙත නිකුත් කරන ලද චෙක් පොත් පරිහරණය කිරීමේදී හෝ අන්‍යාකාරයකින් ගනුදෙනුකරුගේ නොසැලකිල්ල හේතුවෙන් ව්‍යාජ අත්සනක්/ අත්සන් මත චෙක්පතකට ගෙවීම් කිරීමක් සිදුවුවහොත් බැංකුව ඒ පිළිබඳ වගකීම නොදරනු ඇත.
ආ) චෙක්පත් මත ඇති අත්සන්, බැංකුව සතුව ඇති ආදර්ශ අත්සන් කාඩ්පතෙහි දැක්වෙන ආදර්ශ අත්සනට සර්වසම ලෙසින් තිබිය යුතු වන්නේ ය.
ඇ) නිකුත් කරන ලද මුදල වචනවලින් මෙන්ම ඉලක්කම් වලින් ද චෙක්පතෙහි ලිවිය යුතු අතර වචන සහ ඉලක්කම් යන දෙකම පිළිවෙළින් 'රුපියල්' සහ 'රු' යන මුද්‍රිත වචනවලට හැකිතාක් ආසන්නයෙන් ම ආරම්භ කළ යුතුය.
ඈ) චෙක්පතක කිසියම් වෙනසක් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම්, අණකරුගේ සම්පූර්ණ අත්සනින් එම වෙනස් කිරීම සත්‍යාපනය කළ යුතුය.
ඉ) ගෙවීම සඳහා ඉදිරිපත් කරන දිනට මාස හයක් හෝ ඊට වැඩි කාලයකට ඉහත දිනයක් දරන චෙක්පත් සඳහා ගෙවීම බැංකුව ප්‍රතික්ෂේප කළ හැකිය.
ඊ) පසුදාතම යොදන ලද චෙක්පතක් සඳහා අනවධානයෙන් ගෙවීම් සිදුකරගනුදෙනුකරුවෙකුගේ ගිණුමට හර කරනු ලැබ ඇත්තේ නම් ඒ සම්බන්ධව බැංකුව විසින් කිසිදු වගකීමක් භාර නොගනී. පසුදාතම යොදන ලද චෙක්පතක් යනු එය ගෙවීම සඳහා ඉදිරිපත් කරන දිනට පසු දිනයක් දරන චෙක්පතක් වේ.

උපලබ්ධි නොවූ මුදල්වලට නිකුත් කළ චෙක්පත්වලට අනුකූලව කටයුතු කිරීමට බැංකුව භාර නොගනී. 'උපලබ්ධි නොවූ මුදල්' යන්නෙන් අදහස් වන්නේ වෙනත් බැංකුවලින්, මූල්‍ය ආයතනවලින්, රජයේ කාර්යාලවලින් ගෙවීම් උපලබ්ධි වී නොමැති සහ ගනුදෙනුකරුගේ ගිණුමට බැර නොකළ චෙක්පත් හෝ ඇණවුම් ය.

චෙක්පත ඉදිරිපත් කරනු ලබන දිනයේ මුදල් තැන්පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කිසියම් චෙක්පතක් ගෙවීම් නොකොට අගරුවීම සිදුවුවහොත් බැංකුව ඒ සම්බන්ධයෙන් වගකීම නොදරනු ඇත.

කිසිදු අවස්ථානුගත තත්ත්වයක් යටතේ සහ කිසිදු අවස්ථාවක කිසියම් ගනුදෙනුකරුවෙකු විසින් නිකුත් කරන ලද චෙක්පත් වල එකතුව එම ගනුදෙනුකරුගේ ගිණුමේ බැරවීමට පවතින මුදලට වඩා වැඩි නොවිය යුතු අතර මුදල් ආපසු ගැනීම සඳහා පවතින ප්‍රමාණය ඉක්මවා නොයා යුතු වන්නේ ය. ආවරණය නොවූ චෙක්පත් නිකුත් කරනු ලබන ගනුදෙනුකරුවන් සමඟ ඇති සියලුම ව්‍යාපාරික සබඳතා බැංකුව විසින් අවසන් කළ හැකිය.

දැනට ක්‍රියාත්මක වන මෙම නීති සහ බැංකුවේ අනෙකුත් නීතිරීතිවලට පටහැනිව නිකුත් කරනු ලබන ඕනෑම චෙක්පතක් ගෙවීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතු වේ.

චෙක්පතක් ගෙවීම සම්බන්ධයෙන් කලින් ලබා දුන් අණක් අවලංගු කරන අවස්ථාවේ දී ගිණුම් හිමියා විසින් පහත පරිදි කටයුතු කරන බවට එකඟ වන්නේ ය:

අ) ඉදිරිපත් කිරීම මත චෙක්පතට ගෙවීම් සිදු නොකිරීමේ ප්‍රතිඵලය වශයෙන් ඇති වන්නා වූ ඕනෑම අලාභයක් සඳහා බැංකුව වෙත වන්දිපූරණය කරනු ලබන බව;
ආ) චෙක්පත/චෙක්පත් අයකර ගනු ලබන්නේ නම් හෝ විනාශ වී ඇත්නම් හෝ ගෙවීම නැවැත්වීමේ නියෝගය අවලංගු කිරීමට අවශ්‍ය නම් වහාම බැංකුවට ලිඛිතව දැනුම් දෙන බව;
ඇ) නොසැලකිලිමත් භාවයෙන් හෝ පමාද දෝෂයකින් හෝ අයිතම වැරදි ලෙස මෙහෙයවීම තුළින් අයිතම සඳහා බැංකුව විසින් ගෙවනු ලැබුවහොත්

හෝ සහතික කරනු ලැබුවහොත් බැංකුව වගකීම දැරිය යුතු බවට කියා නොසිටින බව;

ඈ) ලිඛිතව සහ නතර කිරීමට අවශ්‍ය චෙක්පතේ නිවැරදි තොරතුරු අඩංගු වන්නේ නම් මිස කලින් දුන් අණ අවලංගු කිරීමක් පිළිගනු නොලැබේ. ප්‍රතිඅණ අවලංගු කිරීම ද ලිඛිතව තිබිය යුතු අතර, අවලංගු කිරීම ලැබීමේ කාලය සහ නතර කරන ලද චෙක්පත ඉදිරිපත් කිරීම අතර සාධාරණ කාලයක් ඉකුත් වන තුරු බලාත්මක නොවනු ඇත. ලිඛිතව අලුත් නොකළහොත් මාස හයකට පමණක් ගෙවීම නැවැත්වීමේ නියෝගයක් බලාත්මක වන්නේ ය. චෙක්පතක් ගෙවීම නැවැත්වීම සඳහා ගනුදෙනුකරුවෙකු විසින් කරනු ලබන සෑම ඉල්ලීමක් සඳහාම බැංකුව විසින් ගාස්තුවක් (බැංකුවේ අභිමතය පරිදි) නියම කරනු ඇත.

තැන්පත් කරන ලද චෙක්පත්වලට අදාළ බැර සටහන්, බැංකුවේ අභිමතය පරිදි, උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් එම සටහනේ දිනට පසු ව්‍යාපාරික දිනයේ දී ආපසු හැරවිය හැක.

බැංකුව විසින් සෑම ජංගම ගිණුමක්ම වරින් වර සමාලෝචනය කර ගිණුම පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් ගාස්තුවක් අය කරනු ඇත. මීට අමතරව, මුදල් නොමැතිකම හේතුවෙන් නොගෙවා අගරු වූ චෙක්පත් සඳහා බැංකුව විසින් කොමිස් මුදලක් අය කරනු ඇත.

බැංකුව විසින් කලින් කලට නියම කරනු ලබන අවම ශේෂය ගනුදෙනුකරුවන් විසින් පවත්වා ගෙන යාම අවශ්‍ය වන්නේ ය.

මින් මතු සඳහන් කරනු ලබන කරුණුවලට යටත්ව බැංකුවේ තැන්පත් කර ඇති අයිතමයන් ලබා ගැනීම සඳහා ගනුදෙනුකරුගේ නියෝජිතයා ලෙස පමණක් බැංකුව ක්‍රියා කරයි. නිෂ්කාශන ස්ථානය හරහා හෝ අන්‍යාකාරයකින් තැපැල් මගින් හෝ අණලදු බැංකුවට හෝ වෙනත් ගෙවන සංවිධානයකට එම අයිතම සම්ප්‍රේෂණය කිරීම සහ ප්‍රවාහනය කිරීම ගනුදෙනුකරුගේ පරම අවදානම සහ වගකීම මත සිදු විය යුතු බවට අවබෝධ කර ගනිමින් එකඟ වී ඇත. බැංකුවේ හෝ එහි නිලධාරීන්ගේ කිසියම් චේතනාන්විත සාවද්‍ය ක්‍රියාවකට හෝ පැහැර හැරීමකට සෘජුව ආරෝපණය කළ හැකි තත්ත්වයන් හැර වෙනත් කිසිදු තත්වයක් යටතේ අයිතමවලට සිදුවන අලාභ හෝ හානි සඳහා බැංකුව වගකිව යුතු නොවන්නේ ය.

එලෙස තැන්පත් කරන ලද චෙක්පත් සහ අනෙකුත් සාධන පත්‍රවල මුදල් බැංකුවට ගෙවීම් ලැබෙන තෙක් ගනුදෙනුකරුගේ ගිණුමට බැර නොකෙරෙනු ඇත. කෙසේ වෙතත්, ලබා ගත් අයිතමයක ප්‍රමාණයෙන් බැංකුව විසින් වහාම ගනුදෙනුකරුගේ ගිණුම බැර කරන්නේ නම්, උපලබ්ධි වීමට ප්‍රථමයෙන් එලෙස ලබා දෙන ලද එම බැර කරන ලද මුදල, එම අයිතමය අගරු වුවහොත්, එම අයිතමයේ වටිනාකම දරන්නා වශයෙන් බැංකුව සෑම විටම ගනුදෙනුකරු වෙත උපයෝජනය කළ යුතු වන්නේ ය.

අයිතමයන් ලබා ගන්නා සෑම අවස්ථාවකදී ම, බැංකුව විසින් ගෙවනු ලබන හෝ දරනු ලබන සෑම ගාස්තුවක් ම ගනුදෙනුකරුගේ ගිණුම සඳහා සහ ඒ වෙනුවෙන් වේ.

ලබා ගැනීම සඳහා තැන්පත් කරන ලද චෙක්පත් හෝ අනෙකුත් අයිතම අගරු වීම සම්බන්ධයෙන් වන දැන්වීම බැංකුව විසින් එය ලද වහාම ලබා දිය යුතු වන්නේ ය.

ලබා ගැනීම සඳහා ගනුදෙනුකරුවකු විසින් ඉදිරිපත් කරන ලද ඕනෑම චෙක්පතක්, බිල්පතක්, සටහනක්, අණකරයක්, ලාභාංශයක්, බලපත්‍රයක් හෝ වෙනත් සාධන පත්‍රයක් මත බැංකුව විසින් සිදු කරන යම් පිටසන් කිරීම්, ඉටු කිරීමක් හෝ ඉටු කිරීම් හේතුවෙන් බැංකුවට දැරීමට හෝ විඳීමට සිදු විය හැකි ඕනෑම අලාභයක් සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් ලබා ගැනීමේ බැංකුකරු ලෙස බැංකුවට හානිපූරණය කළ යුතු අතර බැංකුව විසින් ලබා දෙන එවැනි සෑම ඇපකරයක්ම සෑම අවස්ථාවකදීම ගනුදෙනුකරුගේ ඉල්ලීම මත ලබා දී ඇති බවට සැළකිය යුතු වන්නේ ය.

බැංකුව සමඟ පූර්ව ලිඛිත එකඟතාවයන්ට එළඹ ඇත්තේ නම් මිස, තාවකාලිකව වුවද ගිණුම් අයිරා ගත නොවිය යුතුය. ගිණුමක් අයිරා ගතවුවහොත්, බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රමවේදයට අදාළව, බැංකුව විසින් නියම කරනු ලබන අනුපාතයකට, අයිරා ගත කළ මුදල සඳහා ගනුදෙනුකරු විසින් පොලිය ගෙවිය යුතු වන්නේ ය.

මෙහි ඇති අරමුදල් පිළිබඳ ඕනෑම සඳහනක් චෙක්පත නිකුත්කරනු ලබන සහ/හෝ බැංකුව විසින් ණය පහසුකමක් ලබා දෙන ගිණුමේ බැර ශේෂයට පමණක් වන්නේ ය.

ගනුදෙනුකරු විසින් හෝ බැංකුව විසින් ගිණුමක් වසා දැමීමෙන් පසු, ගනුදෙනුකරු වෙත කලින් නිකුත් කරන ලද සහ භාවිතයට නොගෙන ඉතිරිව ඇති සියලුම චෙක්පත් ආකෘති පත්‍ර බැංකුවේ දේපළ විය යුතු අතර, ගනුදෙනුකරු විසින් වහාම ඒවා බැංකුව වෙත ආපසු ලබා දිය යුතු වන්නේ ය.

හිස් චෙක්පත් ආකෘති පත්‍ර නැතිවීම ගනුදෙනුකරු විසින් වහාම බැංකුවට වාර්තා කළ යුතු වන්නේ ය.

මෙහි දක්වා ඇති අනෙකුත් නියමයන් සහ කොන්දේසි වලට යටත්ව, පවතින අරමුදල් ප්‍රමාණය ඉක්මවා යනු ලබන මුළු ප්‍රමාණයක චෙක්පත් හෝ බිල්පත් කිහිපයක් බැංකුවට එකවර ඉදිරිපත් කරනු ලබන්නේ නම් නිකුත් කිරීම සිදු කරනු ලබන ගිණුමේ ඇති අරමුදල්වලින් කුමන චෙක්පත් හෝ බිල්පත් සඳහා ගෙවීම කරනු ලබන්නේ දැයි තෝරා ගැනීමට බැංකුවට හිමිකම ඇත.

ගනුදෙනුකරුවෙකුගේ අනෙකුත් සියලුම ගිණුම්වල මෙන් ම ජංගම ගිණුමක ඇති අරමුදල් ද බැංකුව වෙත ගනුදෙනුකරුගේ වර්තමාන හෝ ඉදිරි සියලු වගකීම් සඳහා සුරැකුමක් ලෙස බැංකුව විසින් සලකනු ලබන අතර එම වගකීම් ගනුදෙනුකරු විසින් ඉටු නොකරන අවස්ථාවකදී, ගනුදෙනුකරුට දැනුම් දීමකින් තොරව බැංකුව වෙත ගනුදෙනුකරුගේ එම වගකීම් ඉටු කිරීම සඳහා එම අරමුදල් භාවිතා කිරීමට සහ ඉන් අනතුරුව ඒ වනවිටත් නිකුත් කර ඇති චෙක්පත්වලට ගෙවීම ප්‍රතික්ෂේප කිරීමටත් බැංකුවට හිමිකම තිබේ.

මෙම 7 වැනි වගන්තියේ අඩංගු නියමයන් සහ කොන්දේසි චෙක් පොත්වල පිටකවරයන් හි සහ ගෙවීමේ පත්‍රිකා සහ මුදල් ලදුපත් හි සඳහන් රීතිවලට සහ බැංකුවේ අනෙකුත් කොන්දේසි සහ රීති වලට අතිරේකව වන්නේ ය.

ශ්‍රී ලංකා රජයේ නීති සහ රෙගුලාසි සහ ශ්‍රී ලංකාවේ බැංකුවලට පොදු වූ සාමාන්‍ය පරිචයන් සිරිත් විරිත් සහ ක්‍රියා පටිපාටි බැංකුව විසින් විවෘත කරන ලද ජංගම ගිණුම්වල ක්‍රියා කලාපය සහ එක් එක් ගිණුමේ බැරට ගොනු කරන ලද අයිතම උපලබ්ධිවීම සඳහා අදාළ වනු ඇති අතර ඒවා පාලනය කරනු ඇත.

**8. ඉතුරුම් ගිණුම් සඳහා රීති**

බැංකුව විසින් ප්‍රකාශයට පත් කළ යුතු වන යම් අනුපාතයන් සඳහා වන පොලිය සඳහා දෛනික බැර ශේෂයන් මත අවසර ලබා දෙනු ඇති අතර තැන්පත්කරුගේ ගිණුමට මාසිකව බැර කෙරෙනු ඇත.

බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි සාමාන්‍ය බැර ශේෂයන් මත පොලිය සඳහා ඉඩ ලබා නොදෙනු ඇත.

බැංකුව විසින් නියම කර ඇති සාමාන්‍ය අවම ශේෂයට වඩා සාමාන්‍ය ශේෂය පහත වැටෙන විට බැංකුවට සිය පරම අභිමතය පරිදි පොලී ගෙවීම ප්‍රතික්ෂේප කළ හැකිය.

තැන්පත් කිරීම සඳහා බාර ගනු ලබන සියලුම චෙක්පත් සහ අනෙකුත් මූල්‍ය සාධන පත්‍ර අවසාන ගෙවීමට යටත්ව බැර කරනු ලැබේ. පසුව නොගෙවා ආපසු හරවා යවනු ලබන අයිතමයන් සම්බන්ධයෙන් තැන්පත්කරුගේ ගිණුම් වලින් ගාස්තු අය කිරීමේ අයිතිය බැංකුව විසින් රඳවා තබා ගනී.

**9. කාලීන තැන්පතු ගිණුම්**

මුල් හො ඉන් අනතුරුව තැන්පතු කාල සීමාව තුළ තැන්පත්කරුට, තැන්පතුව හෝ එහි යම් කොටසක් මුදා හැරීමට බැංකුවේ වගකීමක් නොමැත.

තැන්පතු කරන අවස්ථාවේ බැංකුව විසින් තැන්පතුකරු/තැන්පතුකරුවන් වෙත නිකුත් කරන ලද කාලීන තැන්පතු ලදුපත පැවරිය නොහැක.

තැන්පතුවේ කල් පිරෙන දිනය ඉකුත් වීමෙන් අනතුරුව කිසිදු පොලියක් උපචය නොවනු ඇත.

තැන්පතුවේ පවතින කාල සීමාව අවසන් වීමට අවම වශයෙන් වැඩ කරන දින හතකට ප්‍රථමයෙන් තැන්පත්කරු/තැන්පත්කරුවන් විසින් බැංකුව වෙත ලිඛිතව උපදෙස් ලබා දී නොමැත්තේ නම්, බැංකුවේ පරම අභිමතය පරිදි සහ පහසුව මත සහ මෙහි අඩංගු කොන්දේසි වලට යටත්ව සහ බැංකුව විසින් කලින් කලට නියම කළ හැකි (පොලී අනුපාතය සහ ආපසු ගැනීමේ කාලසීමාව ඇතුළුව) වෙනත් කොන්දේසි වලට යටත්ව උපචිත පොලී ඇතුළත්ව/ ඇතුළත් නොකොට (අවස්ථානෝචිත පරිදි) එම තැන්පතුව තිබෙන හෝ තබනු ලබන එක් එක් කාල වාරය අවසානයේ වැඩිදුර කාලවාරයක් සහ අනුප්‍රාප්තික කාල පරිච්ඡේදයන් හෝ කාලවාරයන් සඳහා එම කාලීන තැන්පතුව අලුත් කිරීමට බැංකුවට බැඳීමක් නොතිබුණද අයිතියක් සහ අධිකාරියක් තිබේ.

තැන්පතු ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය වන්නා වූ අවම තැන්පතු මුදල බැංකුව විසින් නිශ්චිතව දක්වනු ඇත.

තැන්පතුවක් තැබිය හැකි අවම කාල සීමාව බැංකුව විසින් නිශ්චිතව දක්වනු ඇත. එම අවම කාලසීමාව ඉකුත්වීමට ප්‍රථමයෙන් ගනුදෙනුකරු බැංකුවේ කැමැත්ත ඇතිව තැන්පතුව ඉවත් කර ගන්නා අවස්ථාවක, එවැනි තැන්පතු සඳහා පොලී ගෙවීම බැංකුව විසින් අත්හිටුවිය හැකි බවට ගනුදෙනුකරු එකඟ වේ.

ඉහත කරුණු කෙසේ වුව ද, කල් පිරීමට මත්තෙන් මුදල් ආපසු ගැනීමක දී ඕනෑම තැන්පතුවක් සඳහා එකඟ වූ පොලී අනුපාතය බැංකුවට තම අභිමතය පරිදි අඩු කළ හැකි වේ.

කාලීන තැන්පතුවකට එරෙහිව ගනුදෙනුකරු ණය පහසුකම් ලබාගෙන ඇති අවස්ථාවක, එහි මුල් කාලසීමාව අවසන් වීමට පෙර තැන්පතුව අත්හිටු වීමට සහ එම ණය පහසුකම් මත බැංකුවට ගෙවිය යුතු සහ හිලව් විය යුතු සියලුම මුදල්වලට එදිරිව එවැනි ස්ථාවර තැන්පතුවල මුදල් හිලව් කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුවට බලය පවරයි.

**10. බද්ධ ගිණුම්**

ගිණුමක් බද්ධ ගිණුමක් වන අවස්ථාවක, සියලුම පොලී, කොමිස් මුදල් සහ අනෙකුත් බැංකු ගාස්තු සහ වියදම් ද සමඟ, එවැනි ඕනෑම ගිණුමක් මත පිරිනමන ලද අයිරා ණය හෝ වෙනත් ණය පහසුකම් හෝ පහසුකම් සඳහා බද්ධ ගිණුම් හිමියන් එක්ව සහ තනිව වගකිව යුතු වේ.

කිසියම් ගිණුමක් බද්ධ නම්වලින් ඇති අවස්ථාවක දී, කිසියම් බද්ධ ගිණුම් හිමියෙකුගේ මරණයකදී, එම ගිණුමේ ඉතිරි ගිණුම් හිමියා/ගිණුම් හිමියන් එම ගිණුමේ හිමිකරු/ගිණුම් හිමියන් ලෙස සහ එම ගිණුමේ මුදල් සඳහා හිමිකම් හෝ බැඳියාවක් ඇති එකම පුද්ගලයා /පුද්ගලයන් ලෙස බැංකුව විසින් සැළකිය යුතු වන්නේ ය. ඒ අනුව, මෙහෙයුම් උපදෙස්වලට පටහැනිව කුමන කරුණු පැවතිය ද එම ගිණුමේ මුදල් ජීවත්ව සිටින ගිණුම් හිමියා/හිමියන් වෙත බැංකුව විසින් ගෙවිය යුතු වන්නේ ය.

බද්ධ ගිණුම් හිමියන් වෙත ලබා දීමට අවශ්‍ය වන්නා වූ ඕනෑම දැනුම්දීමක් මූලික ගිණුම් හිමියා වෙත යොමු කළ යුතු වන්නේ ය.

**11. විශේෂ යෝජනා ක්‍රම, වරණීය සැළකිල්ල සහ වරප්‍රසාද**

බැංකුව විසින් ඇතැම් ගනුදෙනුකරුවන් සඳහා විශේෂ යෝජනා ක්‍රම හඳුන්වා දිය හැකි අතර වරණීය සැළකිලි සහ වරප්‍රසාද ලබා දිය හැකිය. එවැනි ගනුදෙනුකරුවන්ගේ ගිණුම් ශේෂයන් මත හෝ බැංකුව විසින් කලින් කලට එහි පරම අභිමතය පරිදි තීරණය කරනු ලබන වෙනත් උපමාන මත පදනම්ව එවැනි වරණීය සැළකිලි සහ/හෝ වරප්‍රසාද ලබා දිය හැකිය. ගිණුම් ශේෂයන් (බැර හෝ හර හෝ බැර සහ හර ශේෂවල එකතුවක්) මත පදනම්ව ගනුදෙනුකරුවකුට වරණීය සැළකිලි හෝ වරප්‍රසාද ලබා දී තිබේද නැද්ද යන්න තීරණය වන අතර බැංකුව විසින් වරින් වර නිශ්චිතව දක්වන ලද අවම ප්‍රමාණයට වඩා එම ශේෂයන් පහළ වැටීම මත එවැනි වරප්‍රසාද සහ/හෝ සැළකිලි ඉවත් කළ හැකි වේ. බැංකුවට ඕනෑම අවස්ථාවක සහ එහි පරම අභිමතය පරිදි ගනුදෙනුකරුවකු වෙත දැනුම් දීමකින් සහ ඒ සඳහා කිසිදු හේතුවක් නොදක්වා එවැනි විශේෂ යෝජනා ක්‍රම, වරණීය සැළකිලි හෝ වරප්‍රසාද ඉවත් කර ගැනීමට අයිතිය තිබිය යුත්තේ ය.

**12. විවිධ**

බැංකුව විසින් ඕනෑම අවස්ථාවක සිය අභිමතය පරිදි ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා වන සුදුසුකම් නිර්ණායක නිශ්චිතව දැක්විය හැකිය.

ඕනෑම ගිණුමකට සහ/හෝ ගනුදෙනුවකට අදාළ වන්නා වූ සියලුම අදාළ තොරතුරු (උදාහරණයක් ලෙස ගනුදෙනුකරුගේ අත්සන) සහ ලේඛන (උදාහරණයක් ලෙස චෙක්පත්) වෙනත් කිසිදු පාර්ශ්වයකට අනවසර කටයුත්තක් සඳහා භාවිතා කළ නොහැකි බව සහතික කිරීම සඳහා නිසි ලෙස තබාගෙන ආරක්ෂා කර ඇති බව සහතික කිරීමට ගනුදෙනුකරු වගබලා ගත යුතුය. තම ගිණුම්, තොරතුරු හෝ ලේඛන යම් අනවසර භාවිතයක් පිළිබඳව දැන ගත්තේ නම් හෝ සැක කරන්නේ නම්, ගනුදෙනුකරු විසින් වහාම ඒ බව බැංකුවට දැනුම් දිය යුතු අතර මෙම සාමාන්‍ය කොන්දේසි සම්බන්ධයෙන් බැංකුවට සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි යම් කටයුතු කිරීමට සහ යම් ලේඛනවලට අත්සන් තැබීම ද සිදු කළ යුතු වන්නේ ය. ව්‍යාජ අත්සන් හෝ සාධනපත්‍රවල අනෙකුත් කොටස් වෙනස් කිරීම හේතුවෙන් විනිමය බිල්පත් බැංකුවට හර කරනු ලැබුවේ නම්, බැංකුව විසින් ඒ අනුව ගනුදෙනුකරුගේ ගිණුම හර කළ හැක.

ගනුදෙනුකරු විසින් බැංකුව වෙත තත්කාලයේ ණයව පවතින්නා වූ මුදල් සහ වගකීම් (මුදල (මුදල් ඇතුළුව) පිළිබඳව හෝ කිසියම් ගනුදෙනුවක්/සම්බන්ධතාවක් සම්බන්ධ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් බැංකුවේ බලයලත් නිලධාරියකු (නිලධාරීන්) විසින් නිකුත් කරන ලද ප්‍රකාශයක් හෝ සහතිකයක් ප්‍රකාශිත දෝෂයක් නොමැති විට, ගනුදෙනුකරුට එරෙහිව තීරනාත්මක විය යුතු අතර ගනුදෙනුකරු මත බන්ධනීය විය යුත්තේ ය.

බැංකුවට ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු යම් මුදලක් සඳහා ගෙවීමක් ලැබෙන්නේ නම් සහ එම ගෙවීම බැංකුවට ලැබිය යුතු මුදල් වර්ගයට වඩා වෙනත් මුදල් වර්ගයකින් නම්, ("ගිණුමේ මුදල්") බැංකුව විසින් තීරණය කරනු ලබන පරිවර්තන කොන්දේසියක් (කොන්දේසි) සහ අනුපාතයක් (අනුපාත)

මත එවැනි ගෙවීමක් ගිණුමේ මුදල් බවට පරිවර්තනය කිරීමට බැංකුවට ඕනෑම අවස්ථාවක හිමිකම් තිබිය යුතු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඕනෑම අවස්ථාවක බැංකුවට දරන්නට සිදු විය හැකි වන්නා වූ සියලුම පාඩු, පිරිවැය සහ වියදම් සම්බන්ධයෙන් ගනුදෙනුකරු බැංකුව වෙත සම්පූර්ණයෙන්ම හානිපූරණය කළ යුතු වන්නේ ය. බැංකුව වෙත (කිසිදු තීන්දුවක් හෝ උසාවි නියෝගයක් යටතේ හෝ අන්‍යාකාරයකින්) ගිණුමේ ඇති මුදලින් සම්පූර්ණයෙන් ගෙවීමක් ලැබී නොමැත්තේ නම් සහ ඉහත සඳහන් කළ ආකාරයට ගිණුමේ මුදල් බවට පරිවර්තනය කිරීමේදී යම් ගෙවීමක් කළ යුත්තේ නම්, ගිණුමේ මුදල් වලින් ප්‍රකාශිත එවැනි ප්‍රමාණයට වඩා අඩු වන ප්‍රමාණයට එම මුදල නිදහස් නොකළ යුතු අතර හිඟය අයකර ගැනීම සඳහා ගනුදෙනුකරුට එරෙහිව වෙනම ක්‍රියාමාර්ගයක් බැංකුවට තිබිය යුතුය.

**13. පැමිණිලි ක්‍රියාපටිපාටිය**

ගනුදෙනුකරුවන්ට ඕනෑම පැමිණිල්ලක් වාචිකව හෝ ලිඛිතව බැංකුව වෙත යොමු කළ හැකිය.

සියලුම වාචික හෝ ලිඛිත පැමිණිලි කළමනාකරුට, ගනුදෙනුකාර අත්දැකීම් වෙත හෝ එවැනි පැමිණිලි ලැබීමට බලයලත් තැනැත්තා වශයෙන් බැංකුවේ කිසියම් නිල ප්‍රකාශනයක හෝ දැන්වීමක නම් කර ඇති හෝ හඳුනාගෙන ඇති වෙනත් පුද්ගලයෙකු වෙත යොමු කළ හැකිය.

ගනුදෙනුකරු වැඩිදුර තොරතුරු දැන ගැනීමට කැමැත්තේ නම්, පහත ආකාරයට www.nationstrust.com හරහා හෝ +94114711411 අංකය ඔස්සේ පැය 24 පුරා ක්‍රියාත්මක වන ඇමතුම් මධ්‍යස්ථානයෙන් බැංකුව සම්බන්ධ කර ගත යුතු වේ:

බැංකුවේ කිසියම් නිෂ්පාදනයකට අදාළ කිසියම් ප්‍රතිලාභයක් සම්බන්ධයෙන් ගනුදෙනුකරුට කිසියම් පැමිණිල්ලක් ඇත්නම්, පැමිණිල්ලේ දැන්වීම ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් කළමනාකරු, ගනුදෙනුකාර අත්දැකීම් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. 242, යුනියන් පෙදෙස, කොළඹ 2 වෙත යොමු කිරීම හෝ +9743 565 656 දුරකථන අංකය හරහා බැංකුව ඇමතීම හෝ customervice@nationstrust.com විද්‍යුත් තැපෑල හරහා ලිපියක් එවීම කළ යුතු වන්නේ ය.

පැමිණිල්ලක් ලැබීමෙන් පසු, එය ලබන්නා විසින් ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථානය/පැමිණිලි කළමනාකරණ පද්ධතිය හරහා පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් බැංකුවේ ගනුදෙනුකාර අත්දැකීම් පිළිබඳ කණ්ඩායම වෙත එම පැමිණිල්ල ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

එකඟ වූ SLA හි විසඳුම් ලබා දීම සඳහා බැංකුවේ ගනුදෙනුකාර අත්දැකීම් පිළිබඳ කණ්ඩායම විසින් සියලුම පැමිණිලි අධීක්ෂණය කර නිසි ලෙස පසු විපරම් කළ යුතුය.

පැමිණිල්ල ඉදිරිපත් කළ දින සිට දින විසි එකක් (21) ඇතුළත බැංකුව විසින් පැමිණිල්ල සම්බන්ධයෙන් ගනුදෙනුකරු වෙතට ප්‍රතිචාර දැක්විය යුතුය. මෙම කාල සීමාව තුළ පැමිණිල්ල පිළිබඳ විමර්ශනය අවසන් කිරීමට බැංකුවට නොහැකි වුවහොත්, එම දින විසිඑකක් (21) යන කාලසීමාව තුළ බැංකුව විසින් ගනුදෙනුකරුට අතුරු ප්‍රතිචාරයක් ලබා දී අවසාන ප්‍රතිචාරය ගනුදෙනුකරු වෙත ලබා දෙන දිනය, උපරිම මාස 3ක කාල රාමුවකට යටත්ව, ගනුදෙනුකරු වෙත දැනුම් දෙනු ඇත.

පැමිණිල්ල නීත්‍යානුකූල බවට බැංකුව නිගමනය කරන්නේ නම්, එයට ප්‍රතිචාරයක් වශයෙන් පැමිණිල්ල විසඳීමට බැංකුව විසින් ගෙන ඇති පියවර පිළිබඳව ගනුදෙනුකරු වෙත දැනුම් දිය යුතුය.

වාචිකව ගනුදෙනුකරුවෙකුගෙන් ලැබෙන ඕනෑම පැමිණිල්ලකට බැංකුව විසින් වාචිකව හෝ ලිඛිතව ප්‍රතිචාර දැක්විය හැකිය. ගනුදෙනුකරුවෙකුගෙන් ලිඛිතව ලැබෙන ඕනෑම පැමිණිල්ලකට බැංකුව ලිඛිතව ප්‍රතිචාර දැක්විය යුතුය.

සියලුම පැමිණිලිවලට පැමිණිල්ලේ භාෂාවෙන් ම ප්‍රතිචාර දක්වනු ඇත.

බැංකුව සමඟ මතු කරන ඕනෑම ගැටලුවක් ගනුදෙනුකරුගේ තෘප්තියට හේතු වන පරිදි විසඳීමට බැංකුව කැමැත්තක් දක්වන අතර, ගනුදෙනුකරුට ද මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලයට හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට ලිඛිතව දන්වා විසඳුම් ඉල්ලා සිටිය හැකිය.

**මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය - ශ්‍රී ලංකාව**
මූල්‍ය සේවා ඔම්බුඩ්ස්මන් කාර්යාලය යනු මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ පැකේජයේ කොටසක් ලෙස 2002 අප්‍රේල් මස ස්ථාපිත ස්වාධීන, අපක්ෂපාතී සහ නිදහස් සේවාවකි.

**මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ සම්බන්ධතා විස්තර:**
143A, වජිර පාර, කොළඹ 5
දුරකථන: +94 11 2595624
ෆැක්ස්: +94 11 2595625
විද්‍යුත් තැපෑල: fosril@sltnet.lk
වෙබ් අඩවිය: www.financialombudsman.lk

**ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL)**

30, ජනාධිපති මාවත, කොළඹ 01
දුරකථන: +94 112477966
පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට කරුණාකර ක්ලික් කරන්න : https://www.cbsl.gov.lk/sites/default/files/fcrd_complaint_submission_form_e.pdf
වෙබ් අඩවිය: https://www.cbsl.gov.lk/en/fcrd

**14. අය කර ගැනීමේ ක්‍රියා මාර්ග සහ අවුරාලීමේ ක්‍රියා පටිපාටිය**

**14.1. ගනුදෙනුකරු විසින් ඔහුගේ/ඇයගේ වගකීම් පැහැර හරින ලද අවස්ථාවකදී බැංකුව විසින් අනුගමනය කළ හැකි අයකර ගැනීමේ ක්‍රියාමාර්ගය පහත පරිදි වන්නේ ය:**

අ. බැංකුව විසින් මුලින්ම ගනුදෙනුකරු සම්බන්ධ කර ගෙන ගනුදෙනුකරුගෙන් නියමිත මුදල අයකර ගැනීමට උත්සාහ කරනු ඇත.

ආ. මේ ආකාරයෙන් නියමිත මුදල අයකර ගැනීමට බැංකුව අපොහොසත් වුවහොත්, ගනුදෙනුකරුගෙන් නියමිත මුදල අය කර ගැනීමට බැංකුවට බාහිර සේවා සපයන්නෙකුගෙන් සහය ලබා ගත හැකිය.

ඇ. බැංකුව විසින් ගනුදෙනුකරුගෙන් නියමිත මුදල අයකර ගැනීමට අපොහොසත් වුවහොත්, බැංකුව විසින් ගනුදෙනුකරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කරනු ඇත.

**14.2 ගනුදෙනුකරුගෙන් ප්‍රතිපූරණය කරනු ලබන්නා වූ බැංකුවේ වියදම්**

බැංකුව විසින් ගනුදෙනුකරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවුවහොත්, ඒ හා සම්බන්ධයෙන් බැංකුවට දැරීමට සිදුවන සියලුම වියදම් සහ විමර්ශන, ප්‍රකාශන සහ අයකර ගැනීම සම්බන්ධයෙන් බැංකුවට දැරීමට සිදුවන සියලුම වියදම් බැංකුවට ගනුදෙනුකරුගෙන් ඉල්ලා සිටිය හැකි වේ.

**14.3 ණය මුදලක්, අයිරාවක් හෝ වෙනත් ඕනෑම ණය පහසුකමක් සඳහා ඇපකරයක් ලෙස තබා ඇති දේපල අවුරාලීමට බැංකුව විසින් භාවිතා කළ යුතු ක්‍රියා පටිපාටිය.**

ණය මුදලක්, අයිරාවක් හෝ වෙනත් ඕනෑම ණය පහසුකමක් ගනුදෙනුකරුවෙකු විසින් ගෙවීම පැහැර හරින ලද අවස්ථාවක, එම ණය මුදල හෝ අයිරාව හෝ එවැනි වෙනත් ණය පහසුකම් (සාමූහිකව "ණය" පහසුකම/ පහසුකම්") සඳහා ඇපකරයක් ලෙස තබා ඇති දේපල අත්පත් කර ගැනීම සඳහා බැංකුව පහත ක්‍රියා පටිපාටිවලින් එකක් අනුගමනය කළ යුතු වන්නේ ය.:

**14.3.1. පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම**

අ) ණය පහසුකමේ ප්‍රමාණය රු. මිලියන 5 කට වඩා වැඩි (හෝ අදාළ වන නීති සහ රෙගුලාසි මගින් නියම කළ හැකි වෙනත් මුදලක්) වන්නේ නම්, බැංකුව විසින් අධ්‍යක්ෂක මණ්ඩල යෝජනාවක් සම්මත කර පුවත්පත් දැන්වීම් පළ කර ප්‍රසිද්ධ වෙන්දේසියක් (පරාටේ ක්‍රියා පටිපාටිය) මගින් දේපළ විකිණීමට පියවර ගත හැකිය. බැංකුව විසින් විකල්පව පරාටේ ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමකින් තොරව, මින්මතු විස්තර කර ඇති පරිදි උකස් බැදුම්කර නඩුකර ක්‍රියා පටිපාටිය යටතේ උකස් බැඳුම්කර බලාත්මක කිරීම සඳහා ගනුදෙනුකරුට එරෙහිව අධිකරණයේ නඩු පැවරිය හැකිය.

ආ). බැංකුව විසින් පරාටේ පටිපාටිය යටතේ පියවර ගන්නේ නම් සහ තුන්වන පාර්ශවයක් වෙන්දේසියේ දී දේපල මිලදී ගන්නේ නම්, විකිණීමෙන් ලැබෙන ආදායමෙන්, ණය පහසුකම් මත බැංකුවට අයවීමට ඇති මුදල් සහ සම්බන්ධිත සියලු වියදම් සහ ගාස්තු බැංකුව විසින් අයකර ගනු ඇති අතර අතිරික්ත මුදල් (වේතොත්) ගනුදෙනුකරු වෙත බාර දෙනු ඇත.

ඇ) වෙන්දේසියේ දී දේපල සඳහා ගැනුම්කරුවන් කිසිවෙකු නොමැත්තේ නම් 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ. (විශේෂ විධිවිධාන) පනත (සංශෝධිත) යටතේ බලතල පැවරී ඇති පරිදි බැංකුව විසින් නාමික ගෙවීමකට තමාගේ නම යටතේ දේපළ අත්පත් කර ගනු ඇත.

ඈ) දේපල අත්පත් කර ගැනීමෙන් අනතුරුව බැංකුව තම අභිමතය පරිදි දේපල නැවත විකිණීමට පියවර ගනු ඇත. නැවත විකිණීමෙන් පසු, බැංකුව විසින් අදාළ ණය පහසුකම මත බැංකුවට ගෙවිය යුතු මුදල සහ සම්බන්ධිත ගාස්තු සියල්ල විකිණීමෙන් ලැබෙන ආදායමෙන් අයකර ගනු ලබන අතර අතිරික්ත මුදල් (වේතොත්) පාර්භෝගිකයා වෙත භාර දෙනු ඇත.

**14.3.2. උකස් බැඳුම්කර නඩුකරය**

අ) ණය පහසුකම් මුදල රුපියල් මිලියන 5 ට වඩා අඩු නම් (හෝ අදාළ වන නීති සහ රෙගුලාසි මගින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් මුදලක්) බැංකුව විසින් උකස් බැඳුම්කරය බලාත්මක කිරීමට සහ ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් දේපල විකිණීමට අධිකරණයෙන් නියෝගයක් ලබා ගැනීමට අධිකරණය ඉදිරියේ නඩු පැවරීම සිදු කරනු ඇත.

ආ) වෙන්දේසියෙන් අනතුරුව විකිණීමෙන් ලැබෙන ආදායමෙන්, ණය පහසුකම මත බැංකුවට හිඟ මුදල අයකර ගෙන අතිරික්ත මුදල් (වේතොත්) ගනුදෙනුකරු වෙත භාර දෙනු ඇත.

**14.4. ගනුදෙනුකරු වෙත එමගින් ඇතිවන ප්‍රතිවිපාක සහ ඔහු/ඇය වෙත ඇති විකල්ප**

ඉහත සඳහන් කළ ඕනෑම අදියරක දී, අයවීමට ඇති ණය පහසුකම් සහ උකස බලාත්මක කිරීමට උද්ගත වූ වියදම් පියවීමට බැංකුව විසින් ගනුදෙනුකරුට ඉඩ සලසනු ඇත. එම අයවීමට ඇති හිඟ මුදල් සියල්ල බැංකුවට ගෙවා පියවීමෙන් අනතුරුව, බැංකුව විසින් ඇපයක් ලෙස තබා ඇති දේපළ ගනුදෙනුකරු වෙත මුදා හරිනු ලැබේ.

**15. අතහැර දැමූ දේපල සහ අක්‍රිය ගිණුම් සම්බන්ධ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි**

**15.1. අතහැර දැමූ දේපල**

අත්හැර දැමූ දේපළ යන්නට ඕනෑම බැංකු ගිණුමක (ජංගම, ඉතුරුම්, කාලීන තැන්පතු හෝ වෙනත්) ශේෂය සහ ඕනෑම බැංකු පහසුකමක් සම්බන්ධයෙන් සුරැකුමක් වශයෙන් හැර (ආරක්ෂිත තැන්පතු ලොකර්වල අන්තර්ගතය වැනි) සහ ඒ සම්බන්ධයෙන් වසර දහයකට (10) වැඩි කාල පරිච්ඡේදයක් පුරා කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැති ගනුදෙනුකරුවෙකු විසින් හෝ ගනුදෙනුකරුවෙකු වෙනුවෙන් බැංකුව දරා සිටින වෙනත් ඕනෑම දේපළක් ඇතුළත් වේ.

වාර්ෂික පදනමින්, සෑම වසරකම අවසානයේ මාස හයක් (06) ඇතුළත, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කිසියම් ආකාරයකින් එම අතහැර දැමූ දේපළ පිළිබඳ වාර්තාවක් බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සිට දින තිහක් (30) ඇතුළත, හිමිකරුගේ නම සහ දේපල සම්බන්ධ තොරතුරු සඳහන් කරමින් එවැනි අතහැර දැමූ දේපල පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් බැංකුව විසින් සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවලින් පුවත්පත්වල පළ කළ යුතු වන්නේ ය.

එයට සමගාමීව, අතහැර දැමූ දේපල පිළිබඳව අදාළ හිමිකරුවන් වෙත ඔවුන් අවසන් වරට හඳුන්වා දුන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් අතහැර දැමූ දේපල පිළිබඳව ඔවුන්ට දන්වා දේපළ සඳහා හිමිකම් පෑමට සාධාරණ කාලපරිච්ඡේදයක් ඔවුන්ට ලබා දෙමින් බැංකුව විසින් දැන්වීම් යැවිය යුතු වන්නේ ය.

ගනුදෙනුකරු විසින් වලංගු හිමිකම් පෑමක් සිදු නොකළහොත්, බැංකුව විසින් සාධාරණ ලෙස තීරණය කරනු ලබන යම් කාල සීමාවක් තුළ බැංකුව විසින්:

අ) අක්‍රිය ගිණුම්වල ශ්‍රී ලංකා මුදලින් පවත්වාගෙන යනු ලබන අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරු කිරීම සහ විදේශ මුදලින් පවත්වාගෙන යන එවැනි අරමුදල් බැංකුවේ අඛණ්ඩව රඳවා තබා ගැනීම කළ යුතු වන්නේ ය.

ආ) ආරක්ෂිත තැන්පතු ලොකර් විවෘත කර එහි ඇති දෑ පිටතට ගත යුතු වන්නේ ය.

අනන්‍යතාවය සනාථ කිරීම මත ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරු කරන ලද එවැනි අරමුදල් සඳහා හිමිකම් පෑමට ගනුදෙනුකරුවන්ට හිමිකම් තිබිය යුතු වන්නේ ය.

වලංගු හිමිකම් පෑමක් ඉදිරිපත් කරන තෙක් ආරක්ෂිත තැන්පතු ලොකරවල ඇති අන්තර්ගතය විනාශ කිරීමකින් තොරව බැංකුවේ සුරක්ෂිත භාරයේ තබා ගත යුතු වන්නේ ය.

අතහැර දැමූ දේපළවලට හිමිකම් කියන ගනුදෙනුකරුවන්ගේ උරුමක්කාරයන් සහ අනුප්‍රාප්තිකයින් නීතියෙන් නියම කර ඇති පරිදි ඔවුන්ගේ හිමිකම් සනාථ කරන ලියකියවිලි බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

ඉහත ක්‍රියා පටිපාටියට අදාළව බැංකුව විසින් දරනු ලබන පිරිවැය අතහැර දැමූ දේපලෙහි හිමිකරුවන්ගෙන් බැංකුව විසින් අය කළ යුතු වන්නේ ය.

**15.2 අක්‍රිය ගිණුම් පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි**

යම් ගිණුමක් අක්‍රිය බව සලකනු ලබන්නේ:

- පහත සඳහන් කාල පරිච්ඡේද සඳහා එනම්
    - ජංගම ගිණුම් - මාස 12
    - ඉතුරුම් ගිණුම් - මාස 24

  සඳහා ගිණුමේ ගනුදෙනුකරු විසින් කිසිදු ක්‍රියාකාරකමක් සිදු කර නොමැති අවස්ථාවක දී:
- ගනුදෙනුකරු සමග සබඳතාවයක් නොමැති අවස්ථාවක් ඇතුළුව අක්‍රිය වර්ගීකරණය සුදුසු යැයි බැංකුව විසින් සලකන වෙනත් කිසියම් හේතුවක් ඇත්තේ නම්.

කෙසේ වුවත්, බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ/හෝ අදාළ වන නීති සහ රෙගුලාසි මත පදනම්ව, ඉහත සඳහන් කරන ලද කාලසීමාවන් බැංකුව විසින් කලින් කලට සංශෝධනය කළ හැකි ය.

බැංකුව විසින් අක්‍රිය ගිණුමක් නැවත සක්‍රිය කිරීමට පෙර ගනුදෙනුකරු සමඟ සම්මුඛ සාකච්ඡාවක් පවත්වා අක්‍රිය තත්ත්වය පිළිබඳව පැහැදිලි කිරීමක් ලබා ගත හැකි ය. ගනුදෙනුකරු ඉල්ලා සිටින්නේ නම්, එවැනි පැහැදිලි කිරීමක් ගනුදෙනුකරු විසින් ලිඛිතව බැංකුව වෙත ලබා දිය යුතු වන්නේ ය.

අක්‍රිය ගිණුමක් නැවත සක්‍රිය කිරීමට පෙර බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති ලේඛන බැංකුව වෙත ඉදිරිපත් කිරීමට බැංකුව තම අභිමතය පරිදි ගනුදෙනුකරුගෙන් ඉල්ලා සිටිය හැක උදා. ගනුදෙනුකරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත, සමාගම් ලියාපදිංචි සහතිකය.

ගිණුමක් අක්‍රිය ලෙස වර්ගීකරණය කර ඇති අවස්ථාවක, එවැනි අක්‍රිය තත්ත්වය ඉවත් කළ යුතු බවට සෑහීමකට පත්වන තුරු, එම ගිණුම මත නිකුත් කරන ලද චෙක්පත් ගෙවීම ඇතුළුව, එම ගිණුම මත වන ගනුදෙනු ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට අයිතියක් තිබිය යුතු වන්නේ ය.

**16. 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුකූලව මූල්‍ය බුද්ධි ඒකකය ("FIU") වෙත සැක කටයුතු ගනුදෙනු සම්බන්ධයෙන් වන නීති**

කිසියම් ගනුදෙනුවක් හෝ ගනුදෙනුවකට තැත්කිරීමක්, කිසියම් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ වෙනත් සාපරාධී වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් හෝ ඕනෑම පුද්ගලයකු, පුද්ගල කණ්ඩායමක් හෝ ආයතනයක් විසින් මුදල් විශුද්ධිකරණය,ත්‍රස්තවාදයට මුදල් සැපයීම ඇතුළු ඕනෑම යෝජිත නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධමය වරදකට අදාළ විය හැකි තොරතුරු බැංකුව සතුව ඇති බවට බැංකුව වෙත සාධාරණ හේතු ඇත්තේ නම් බැංකුව විසින් එය වහාම මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතුය.

එබඳු වාර්තාවක් මූල්‍ය බුද්ධි ඒකකයෙහි අවශ්‍යතාවය පරිදි එවැනි ආකෘතියකින් එම විස්තර ඇතුළත් කර සෑදිය යුතු වන්නේ ය.

කිසියම් ගනුදෙනුවක් සිදු නොකරන ලෙසට මූල්‍ය බුද්ධි ඒකකය විසින් බැංකුව වෙත නියෝග කරනු ලබන්නේ නම්, මූල්‍ය බුද්ධි ඒකකය වෙත අවශ්‍ය විමසීම් කිරීමට සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල සහාය ලබා ගැනීමට ඉඩ ලබා දීම පිණිස බැංකුව විසින් ගනුදෙනුව අත්හිටුවිය යුතුය.

මෙම නීතිරීති යටතේ බැංකුව විසින් ගනු ලබන යම් ක්‍රියාමාර්ගයක් පිළිබඳව දැනුවත්වීමට ගනුදෙනුකරු හිමිකම් නොලබන අතර බැංකුව විසින් ගනු ලබන එවැනි ක්‍රියාවක් සම්බන්ධයෙන් ගනුදෙනුකරු වෙත දැනුම් දීමට බැංකුව කිසිදු ආකාරයකින් බැඳී සිටීමක් හෝ වගකීමක් නොදරන්නේ ය.

**17. 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනතට අනුකූලව මූල්‍ය බුද්ධි ඒකකය ("FIU") වෙත ඉහත පර්යන්තගනුදෙනු පිළිබඳව වාර්තා කිරීම හා සම්බන්ධ නීති**

රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණය ඉක්මවන සෑම මුදල් ගනුදෙනුවක්ම සහ විද්‍යුත් අරමුදල් හුවමාරුවක් සම්බන්ධයෙන් ම මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිශ්චිත කරනු ලබන ආකෘතියකින් සහ අදාළ කාල සීමාවක් තුළ මූල්‍ය බුද්ධි ඒකකය වෙත බැංකුව විසින් වාර්තා කිරීම අවශ්‍ය වේ.

වාර්තා කිරීම අවශ්‍ය වන්නා වූ විද්‍යුත් මුදල් පැවරුම් අතරට අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණ, SLIP පැවරුම්, RTGS ගනුදෙනු, ක්‍රෙඩිට් කාඩ් ගනුදෙනු, ඩෙබිට් කාඩ්පත් ගනුදෙනු (අදාළ වන්නේ නම්) සහ NRFC ගිණුම් සහ RFC ගිණුම්වලට අදාළ ගනුදෙනු ඇතුළුව නමුත් ඒවාට සීමා නොවන කුමන හෝ ආකාරයකින් කරන ලද විද්‍යුත් මුදල් පැවරුම් ඇතුළත් විය යුත්තේ ය.

මෙම නීතිරීති යටතේ බැංකුව විසින් ගනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක් සම්බන්ධයෙන් බැංකුව කිසිදු ආකාරයකින් ගනුදෙනුකරු වෙත බැඳී සිටීමක් හෝ වගකීමක් නොදැරිය යුත්තේ ය.

**18. බැංකුකරණයේ රහස්‍යභාවය**

**18.1 හෙළිදරව් කිරීම**

එවැනි අරමුණක් හෝ අරමුණු සඳහා බැංකුව සහ/හෝ බැංකුවේ ඕනෑම ශාඛාවක් සමග ගනුදෙනුකරුගේ සහ/හෝ ගනුදෙනු හෝ ගිණුමක් (ගිණුම්)

පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමට ගනුදෙනුකරු මෙයින් කැමැත්ත පළ කර බැංකුව වෙත බලය පවරයි.

## 19. අවසන් කිරීම සහ අත්හිටුවීම

### 19.1 ගනුදෙනුකරුගේ අවසන් කිරීමේ අයිතිය

අවසන් කිරීමේ ප්‍රතිපාදනවලට බැංකුව සහ ගනුදෙනුකරු අන්‍යාකාරයකින් ලිඛිතව එකඟ වී නොමැත්තේ නම් සහ මෙහි අඩංගු වෙනත් විධිවිධානවලට සහ විශේෂිත සම්බන්ධතාවයක් පාලනය කරන එවැනි විශේෂ කොන්දේසිවලට යටත්ව, ගනුදෙනුකරුට ඕනෑම අවස්ථාවක, බැංකුවට සාධාරණ පූර්ව ලිඛිත දැනුම්දීමක් ඇතිව, සමස්තයක් ලෙස ව්‍යාපාරික සබඳතාවයක් හෝ ගනුදෙනුකරුට බැංකුව සමඟ ඇති කිසියම් විශේෂිත ව්‍යාපාරික සබඳතාවයක් අවසන් කළ හැකිය. කෙසේ වුව ද, එවැනි අවසන් කිරීමක් තුළින් එම අවසන් කිරීමට ප්‍රථමයෙන් බැංකුව වෙත උපචිත වූ අයිතිවාසිකම්වලට බලපෑමක් නොවිය යුත්තේ ය.

### 19.2 සාධාරණ හේතු මත අවසන් කිරීම

බැංකුව සහ ගනුදෙනුකරු අතර විශේෂිත ව්‍යාපාරික සම්බන්ධතාවයක් සඳහා කාල සීමාව සම්බන්ධ යම් කොන්දේසියක් හෝ අවසන් කිරීමේ විධිවිධානයක් සඳහා එකඟ වී ඇත්නම්, එවැනි සම්බන්ධතාවයක් අවසන් කළ හැක්කේ එවැනි කොන්දේසියකට හෝ විධිවිධානයකට අනුකූලව පමණි.

### 19.3 බැංකුවෙහි අවසන් කිරීමේ අයිතීන්

**(අ) දැනුම්දීමක් මත අවසන් කිරීම**

ගනුදෙනුකරු වෙත බැංකුවේ මතය අනුව සාධාරණ වන්නා වූ දැනුම් දීමක් ලබා දීම මත බැංකුව සහ ගනුදෙනුකරු අතර ලිඛිතව යම් කොන්දේසියක් හෝ අවසන් කිරීමේ විධිවිධානයකට එකඟ වී නොමැති ගනුදෙනුකරුවෙකු සමඟ වන සමස්ත ව්‍යාපාරික සබඳතාවය හෝ කිසියම් විශේෂිත ව්‍යාපාරික සබඳතාවක් බැංකුව විසින් ඕනෑම අවස්ථාවක අවසන් කළ හැකිය. කෙසේ වුව ද, එවැනි අවසන් කිරීමක් තුළින් එම අවසන් කිරීමට ප්‍රථමයෙන් බැංකුව වෙත උපචිත වූ අයිතිවාසිකම්වලට බලපෑමක් නොවිය යුත්තේ ය.

**ආ) ස්ථාවර කාල සීමාවක් නොමැති ණය මුදල් හෝ බැංකු පහසුකම් අවසන් කිරීම**

ස්ථාවර කාලවාරයක් හෝ අවසන් කිරීමේ විධිවිධානයක් ලිඛිතව එකඟ වී නොමැති ණය හෝ ණයවර හෝ බැංකු පහසුකම්/බැඳීම් පූර්ව දැනුම්දීමකින් තොරව බැංකුව විසින් තම අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක අවසන් කළ හැකිය. කෙසේ වුව ද, එවැනි ඕනෑම අවසන් කිරීමක් සඳහා එම අවසන් කිරීමට ප්‍රථමයෙන් බැංකුව වෙත උපචය වී ඇති අයිතිවාසිකම්වලට බලපෑමක් නොවිය යුත්තේ ය.

**ඇ) දැනුම්දීමක් නොමැතිව සාධාරණ හේතුව මත අවසන් කිරීම**

බැංකුවට ගනුදෙනුකරුවෙකු සමඟ ඇති සිය ව්‍යාපාරික සබඳතාවයක් අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිගත නොහැකි බවට පත් වන්නා වූ සාධාරණ හේතුවක් තිබේ නම් දැනුම් දීමකින් තොරව සිය ව්‍යාපාරික සබඳතාව සම්පූර්ණයෙන් හෝ කිසියම් විශේෂිත සබඳතාවක් සම්බන්ධයෙන් ගනුදෙනුකරුවෙකු සමඟ ඇති සිය ව්‍යාපාරික සබඳතාවය අවසන් කළ හැකිය. කෙසේ වුව ද, එවැනි ඕනෑම අවසන් කිරීමක් එම අවසන් කිරීමට ප්‍රථමයෙන් බැංකුව වෙත උද්ගත වී ඇති අයිතිවාසිකම්වලට බලපෑමක් නොවිය යුත්තේ ය.

**ඈ) අවසන් කිරීමෙන් අනතුරුව ගෙවා පියවීම**

යථොක්ථ අයුරින් බැංකුව ගනුදෙනුකරු සමග ඇති ව්‍යාපාරික සබඳතාව හෝ පහසුකම් අවසන් කිරීම මත ගනුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතු සියලුම මුදල් හා ගනුදෙනුකරුට බැංකුව කෙරෙහි ඇති ඕනෑම වගකීමක් බැංකුව විසින් ඉල්ලීම මත අයවීමට හිඟ බවට පත් වේ නම් වහාම ගෙවිය යුතු වේ. බැංකුව සහ ගනුදෙනුකරු අතර සිදුවන සියලුම විදේශ විනිමය සහ අනෙකුත් ව්‍යුත්පන්න ගනුදෙනු දැනුම්දීමක් සහිතව අවසන් කිරීමට බැංකුවට අයිතිය ඇති අතර එවැනි ගනුදෙනු යටතේ ගෙවිය යුතු මුදල් බැංකුව විසින් තීරණය කරනු ලබන වෙළඳපල වටිනාකමට හිඟ බවට පත් වී ගෙවිය යුතු වන්නේ ය. බැංකුව වෙත ගනුදෙනුකරුගේ ඇති ඕනෑම අයවීමට හිඟ ඉදිරි හෝ අවිනිශ්චිත වගකීමක් සම්බන්ධයෙන්, ගනුදෙනුකරු බැංකුවේ අවශ්‍යතාව පරිදි යම් කොන්දේසි මත ඒ සඳහා ප්‍රමාණවත් මූල්‍ය ආවරණයක් වහාම සැපයිය යුතු වන්නේ ය.

### 19.4. ගිණුමක් අත්හිටුවීමට බැංකුවට ඇති අයිතිය

19.4.1. ගනුදෙනුකරුගේ ඕනෑම ගිණුමක්/ගිණුම් අත්හිටුවීම හෝ තහනම් කිරීම සහ/හෝ ගනුදෙනුවක් ප්‍රමාද කිරීම, අවහිර කිරීම, තහනම් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට අයිතිය ඇත.:

අ) අධිකරණ නියෝගයකට හෝ නීතියට අනුකූලව රාජ්‍ය/නියාමන ආයතනයක නියෝගයකට අනුකූල වී බැංකුවට කටයුතු කිරීම සඳහා;

ආ) ගනුදෙනුකරු බුන්වත් බව ප්‍රකාශ කර ඇති අවස්ථාවක දී;

ඇ) ගනුදෙනුකරුගේ ගිණුමේ ප්‍රමාණවත් මුදලක් නොමැති අවස්ථාවක දී;

ඈ) ගිණුමේ ඇති මුදල්වල අයිතිය හෝ ගිණුම භාවිතා කරන්නේ කවුරුන්ද යන්න සම්බන්ධයෙන් ආරවුලක් පිළිබඳව බැංකුවට දැනුම් දී ඇති අවස්ථාවක දී;

ඉ) ගිණුමේ එක් පාර්ශවයක් හෝ සියලුම පාර්ශවයන්, බැංකුව හෝ ගිණුමේ අයිතිවාසිකම් සඳහා නිත්‍යානකූල ලෙස හිමිකම්පාන තෙවන පාර්ශවයක් ආරක්ෂා කිරීමට;

ඊ) බැංකුව විසින් තම හිඟ අයකර ගැනීමේ අයිතිවාසිකම් ක්‍රියාවට නංවා ගනුදෙනුකරුගෙන් අයවිය යුතු ඕනෑම මුදලක් අයකර ගැනීමට;

උ) බැංකුවේ අභ්‍යන්තර මෙහෙයුම් අවශ්‍යතා සඳහා (ණය සහ අවදානම් කළමනාකරණය, පද්ධතිය හෝ නිෂ්පාදන සංවර්ධනය සහ සැලසුම් කිරීම, රක්ෂණය, විගණනය සහ පරිපාලන අරමුණු ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී);

ඌ) මූල්‍යමය අපරාධයක් කිරීමේ හැකියාව සම්බන්ධයෙන් හෝ සිදුවිය හැකි මූල්‍ය අපරාධ අවදානමක් සම්බන්ධයෙන් ගනුදෙනුකරුවෙකු විසින් බැංකුව වෙත කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බැංකුවට සැක පහළ වන අවස්ථාවක දී;

එ) බැංකුව විසින් එහි නියාමන සහ අනුකූලතා බැඳීම් (මුදල් විශුද්ධිකරණයට එරෙහිව සහ ත්‍රස්තවාදී මූල්‍ය සැපයීම්කරණයට එරෙහිව කටයුතු කිරීමට අදාළ ඒවා ඇතුළුව) හෝ ඒ ආශ්‍රිත අවදානම් කළමනාකරණය කිරීමට බැංකුවට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා;

ඒ) බැංකුවේ අයිතිවාසිකම් බලාත්මක කිරීම හෝ විත්තිවාචනය කිරීම සඳහා; හෝ

ඔ) එවැනි අත්හිටුවීමක්, අවහිර කිරීමක්/තහනම් කිරීමක් හෝ ප්‍රමාද කිරීමක් සුදුසු යැයි බැංකුව විසින් තම පරම අභිමතය පරිදි සලකන වෙනත් ඕනෑම අවස්ථාවක් සඳහා

19.4.2. පවතින තත්ත්වයන් මත ගිණුම අත්හිටුවීම පිළිබඳ පූර්ව දැනුම්දීමක් කිරීමට බැංකුවට හැකියාවක් නොමැති බව ගනුදෙනුකරු පිළිගනී. කෙසේ වෙතත්, එවැනි අත්හිටුවීමක් පනවා සාධාරණ කාලයක් ඇතුළත බැංකුව විසින් දැනුම් දිය යුතු වන්නේ ය.
බැංකුව විසින් ඉහත සඳහන් කළ ආකාරයෙන් තම අයිතීන් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ගනුදෙනුකරුට විඳින්නට සිදු වූ හෝ දරන්නට සිදු වූ අලාභයක්/හානියක් සඳහා බැංකුව කිසිදු ආකාරයකින් වගකිව යුතු නොවේ.

19.4.3. මෙම වගන්තිය යටතේ වන අයිතිවාසිකම් එම අයිතිය හෝ අධිකාරිය ක්‍රියාවට නැංවීමේ දින හෝ ඊට ප්‍රථමයෙන්, බැංකුවේ ඕනෑම නිලධාරියෙකු මත ගනුදෙනුකරු විසින් නිකුත් කරන ලද චෙක්පත්, ඉල්ලීම්, හෝ මුදල් ආපසු ගැනීම් හෝ වෙනත් එවැනි ලේඛන සම්බන්ධයෙන් අනනුකූල වීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සීමාවන් දක්වා වුවද බැංකුවට ක්‍රියා කළ හැකි විය යුතු අතර බැංකුවේ එවැනි ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස බැංකුව වෙත ඉදිරිපත් කළ හැකි වන්නා වූ සියලුම හිමිකම් පෑම්වලට හෝ ඉල්ලීම්වලට එදිරිව බැංකුවට හානිපූරණය කිරීමට ගනුදෙනුකරු මෙයින් පොරොන්දු වන්නේ ය.

20. බැංකුවේ නිපැයුම් සහ සේවා පිළිබඳ අවදානම

වෙළඳපල අවදානම සිය මූල්‍ය තත්වයට සැලකිය යුතු ලෙස බලපෑ හැකිබව ගනුදෙනුකරු පිළිගෙන තේරුම් ගනී.ගනුදෙනුකරුවාට බැංකුවේ නිමැවුම් සහ සේවාවන් පිළිබඳ හොඳින් දැනුවත්ව තීරණ ගැනීමට මෙම අවදානම් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ. පහත ලැයිස්තු ගත අවදානම් අවම කිරීම සඳහා විවිධාංගිකරණය, නිතිපතා කළඹ සමාලෝචන පැවැත්වීම සහ වෙළඳපල තත්වයන් පිළිබඳව දැනුවත්භාවය වැනි උපාය මාර්ග භාවිතා කිරීමට ගනුදෙනුකරුට උපදෙස් දෙනු ලැබේ. මේවා හුදෙක් නියෝජන නිදර්ශන වන අතර එයට සම්බන්ධ විය හැකි අවදානම් පිළිබඳ පරිපූර්ණ ලැයිස්තුවක් නොවේ.

අ : පොලී අනුපාත අවදානම
පොලී අනුපාතවල විචලනයන් මූල්‍ය වත්කම් සහ වගකීම්වල වටිනාකමට අහිතකර ලෙස බලපෑ හැකිබව ගනුදෙනුකරු පිළිගනී. සාමාන්‍යයෙන් පොලී අනුපාතය ඉහළ යාම බැඳුම්කර වැනි තත්කාලින මූල්‍ය වත්කම්වල වල වටිනාකම අඩුවීමට හේතු විය හැකි අතර ණය දීමේ පහසුකම් සඳහා ඉහළ පිරිවැයක්ද ඇති විය හැක.ඊට පටහැනිව, පොලී අනුපාත අඩුවීම ප්‍රතිවිරුද්ධ බලපෑමක් ඇති කළ හැකිය. මෙම වෙළඳපල තත්වයන් ආර්ථික අස්ථාවර කාලපරිච්ඡේදයන්ද ඇතුළුව ගනුදෙනුකරුගේ සමස්ථ ගොනුවට සැලකිය යුතු ලෙස බලපෑ හැක.

ආ : මූල්‍යමය අවදානම
විදේශ වත්කම්වල හෝ විදේශ මුදල්වලින් නම් කර ඇති වත්කම් වල ආයෝජනය කිරීම, විනිමය අනුපාත උච්චාවචනයන්ට යටත් වන බැවින් එය, ප්‍රතිලාභවලට බලපෑම් කළ හැකි බව ගනුදෙනුකරු පිළිගනී. ආයෝජකයාගේ දේශීය මුදලට සාපේක්ෂව විදේශ මුදලේ අගය අවප්‍රමාණය වුවොත් මූල්‍ය අවදානම හරහා පාඩු ඇති විය හැක. මෙයට අමතරව මූල්‍ය විනිමය අනුපාතවල වෙනස්වීම ණයවර ලිපි පියවීම සහ වෙනත් සමාන ගනුදෙනු වැනි බැංකු පහසුකම් කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය.

ඇ : කොටස් අවදානම
කොටස් මිල පහත වැටීම නිසා පාඩු වීමේ අවධානමක් ඇති බව ගනුදෙනුකරු පිළිගනී. වෙළඳපල අවපාතයන් හෝ තනි සමාගම්වල අවම කාර්ය සාධනය නිසා කොටස්වල ආයෝජනය කරන ගනුදෙනුකරුවන්ගේ කළඹ වටිනාකම අඩු වීමට හේතු විය හැක.

ඈ ව්‍යාපාර අවසන් කිරීමේ අවදානම
ඇතැම් ආයෝජන ඒවායේ මිලට සැළකිය යුතු ලෙස බලපෑමක් නොකර ක්ෂණිකව එම ව්‍යාපාර ඈවර කිරීමට අපහසු විය හැකිබව ගනුදෙනුකරු පිළිගනී. මෙකී අවදානම වෙළඳපල ආතතිමය කාලයන්හිදී ඉහළ යා හැක. මෙය සිය අරමුදල් වෙත ඉක්මනින් ප්‍රවේශ වීමට අවශ්‍ය ගනුදෙනුකරුවන්ට අභියෝගාත්මක බලපෑමකි.

ඊ: ප්‍රතිආයෝජන අවදානම
ආයෝජකයෙකුට ආදායම හෝ ආයෝජන වලින් ලද මූලික ගෙවීම්, මූලික ආයෝජනයට වඩා අඩු පොලී අනුපාතයකට නැවත ආයෝජනය කිරීමට සිදුවීම මගින් ප්‍රතිආයෝජන අවධානම ඇති වන බව ගනුදෙනුකරු පිළිගනී.

උ :වෙළඳපල අස්ථායිතා අවදානම
වෙළඳපල මිල ගණන් කෙටි කාලීනව සැලකිය යුතු උච්චාවචනයන් අත්විඳිය හැකි බව ගනුදුනුකරු පිළිගනී.. මෙම අස්ථාවරත්වය කොටස් බැඳුම්කර සහ අන්‍යෝන්‍ය අරමුදල් වැනි ආයෝජනවලට බලපෑම් කල හැකි අතර එමගින් සැලකිය යුතු පාඩු හෝ ලාභ ලැබීමට හේතුවිය හැක.

ඌ) පද්ධතිමය අවධානම

පුද්ගලික ආයෝජන මත පමණක් නොව ගනුදෙනුකරුගේ ණය ගැනීම් සම්බන්ධයෙන් ද සැලකිය යුතු අලාභයක් ඇති කළ හැකි පුලුල්ව පැතිරුනු මූල්‍ය පද්ධතිය අසාර්ථක වීමේ හෝ වෙළඳපල කඩා වැටීමේ අවදානම ගනුදෙනුකරු පිළිගනී. ආයෝජන වටිනාකම සහ ණය වගකීම් සපුරාලීමට ගනුදෙනුකරුගේ හැකියාව යන දෙකටම බලපෑම් ඇති කළ හැකි මූල්‍ය අර්බුද, ආර්ථික පසුබෑම් හෝ භූ දේශපාලනික සිදුවීම් වලින් පද්ධතිමය අවදානම මතු විය හැක.

එ) දේශපාලන හා ආර්ථික අවධානම

රජයේ ප්‍රතිපත්ති, රෙගුලාසි හෝ ආර්ථික තත්ත්වයන්හි වෙනස්වීම් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට බලපෑ හැකි අතර ඒවා ගනුදෙනුකරුගේ ආයෝජන සහ ණය ගැනීම් යන දෙකටම බලපෑ හැකි බව ගනුදෙනුකරු පිළිගනී. වෙළඳ ප්‍රතිපත්ති, බදු නීති සහ ආර්ථික සම්බාධක වැනි සාධක ආයෝජනවලට බලපෑම් ද අවිනිශ්චිතතාවයන් ද ඇති කළ හැකි අතර ආයෝජනවල වටිනාකමට මෙන්ම ණය ගිවිසුම් යටතේ ඇති ගනුදෙනුකරුගේ වගකීම් වලටද බලපෑම් කළ හැකිය.

ඒ) ණය අවධානම

බැංකු නිපයුම් සහ සේවා භාවිතා කිරීමෙහිලා ණය අවධානමක් ඇති බව ගනුදෙනුකරු  පිළිගෙන එකඟ වේ.  ණය පහසුකම් සඳහා වන වගකීම නියමිත වෙලාවට පියවීම ඉතා වැදගත්වේ. නියමිත වේලාවට ණය පහසුකම් පියවීමට අපොහොසත් වීමෙන් දණ්ඩ පොලී සහ ගාස්තු අය කෙරේ. ණය පියවීම නොකරන අවස්ථාවල නීත්‍යානුකූල ප්‍රතිසාධන ක්‍රියාමාර්ග ගැනීමට සහ ගනුදෙනුකරු විසින් සපයනු ලබන ඕනෑම සුරැකුම්පත්  ඈවර කිරීමට බැංකුවට අයිතිය ඇත. ණය පහසුකම් පිරිනැමීමේ නියමයන් සහ කොන්දේසි වලට අනුකූල නොවීම ගිවිසුම  කිරීමක් ලෙස සලකනු ලැබේ. ණය පහසුකම් සෑහීමකට පත් නොවන ආකාරයට සැපයීම  ක්‍ෂෑෂර් වෙත වාර්තා කරනු ලබන අතර, එය ගනුදෙනුකරුගේ ණය පැතිකඩට අහිතකර ලෙස බලපායි. තවද, දුර්වල ණය හැසිරීම් පවතින පහසුකම් සීමා කිරීමට හෝ අනාගත පහසුකම් සඳහා නුසුදුසු වීමට හේතු විය හැක.

ඔ) මෙහෙයුම් අවදානම

බැංකු නිපයුම් සහ සේවා භාවිතය තුළ මෙහෙයුම් අවධානම ආවේනික බව ගනුදෙනුකරු පිළිගනී. මෙම අවදානමට සේවා කඩාකප්පල් කළ හැකි සහ මූල්‍ය අලාභවලට හේතු විය හැකි දෝෂ, වංචා හෝ පද්ධති අසාර්ථකවීම් ඇතුළත් වේ. විශේෂයෙන්ම, පුද්ගලික තොරතුරු සහ මූල්‍ය දත්ත සයිබර් ප්‍රහාරවලට ගොදුරු විය හැකි, අනන්‍යතා සොරකම් කිරීමට හෝ මූල්‍ය අලාභයන්ට තුඩු දිය හැකි, සයිබර් ආරක්ෂණ අවධානම සැලකිය යුතු කරුණක් ලෙස ගනුදෙනුකරු හඳුනා ගනී. තම තොරතුරු ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රවේශම් සහගතව සහ ආරක්ෂිත අන්තර්ජාල බැංකුකරණ පිළිවෙත් පිළිපදින ලෙස ගනුදෙනුකරුට උපදෙස් දෙනු ලැබේ. එවැනි අවදානම් හේතුවෙන් සිදුවන පාඩු සඳහා බැංකුව වගකියනු නොලැබෙන අතර, ඔවුන්ගේ පුද්ගලික සහ මූල්‍ය දත්ත ආරක්ෂා කිරීමට සුදුසු පියවර ගැනීම ගනුදෙනුකරුගේ වගකීම වේ.

## 21 . වගකීමෙහි සීමාව

### 21.1 වගකීමෙහි සීමාවන්

තම වගකීම් ඉටු කිරීමේදී බැංකුව තම කාර්ය මණ්ඩලයේ චේතාන්විත පැහැර හැරීම හෝ බරපතල නොසැලකිල්ල සම්බන්ධයෙන් පමණක් වගකිව යුතු වේ.

### 21.2 තුන්වන පාර්ශ්ව වෙත පවරන ලද නියෝග

නියෝගයක හෝ ගනුදෙනුවක අන්තර්ගතය එය තවදුරටත් ක්‍රියාත්මක කිරීම සඳහා තෙවන පාර්ශවයකට බැංකුව සාමාන්‍යයෙන් භාර දෙන්නේ නම් හෝ භාර දීම සුදුසු යැයි සලකන්නේ නම්, බැංකුව විසින් එම නියෝගය හෝ ගනුදෙනුව ස්වකීය නමින්ම තෙවන පාර්ශවයට ලබා දීම මගින් එය සිදු කරයි.

### 21.3 බැඳියාව අහිමි වීම

නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන ප්‍රමාදයන් හෝ වැරදි මඟ පෙන්වීම් හෝ ඒ සම්බන්ධයෙන් වන කිසියම් උපදෙසක් හේතුවෙන් යම් අලාභයක් සිදුවන්නේ නම්, පොලිය සම්බන්ධයෙන් වන අලාභය සඳහා පමණක් බැංකුව වගකිව යුතු වන්නේ ය. මුදල්වල වටිනාකම හෝ ගෙවීමේ මාධ්‍යයේ හුදු වෙනසක් මත පදනම් වූ අලාභයක් සම්බන්ධයෙන් කිසිදු වගකීමක් භාර නොගනී.

## 22. හානිපූරණය

ගනුදෙනුකරුට ණය හෝ වෙනත් බැංකු පහසුකම් ලබා දීම හෝ ගනුදෙනුකරු වෙනුවෙන් යම් බැංකු සේවාවක් සිදු කිරීමට අදාළව හෝ ඒ තුලින් පැන නගින බැංකුවට දරන්නට හෝ විඳින්නට සිදු වන්නා වූ ඕනෑම සහ සියලුම හිමිකම්පෑම්, ඉල්ලීම්, නඩු, හානි, වගකීම්, පිරිවැය, අලාභ, වියදම් සහ වෙනත් මුදල් සඳහා ගනුදෙනුකරු විසින් බැංකුව වෙත හානිපූරණය කළ යුතු අතර බැංකුව විසින් සිදු කළ හෝ දරන ලද එවැනි ඕනෑම ගෙවීමක් සම්බන්ධයෙන් ගෙවන ලෙසට විධාන කොට ඉල්ලා සිටීම මත මත බැංකුව වෙත ප්‍රතිපූරණය කළ යුතු වේ.

## 23. අනුපාතික බලපෑම

කෝලාහල, යුද්ධය, ස්වාභාවික විපත්, බැංකුවේ පාලනයෙන් ඔබ්බට ගිය ඕනෑම අවස්ථානුගත තත්ත්වයක් හෝ බැංකුව වගකිව යුතු නොවන්නා වූ වෙනත් සිදුවීම් (උදා: වැඩ වර්ජන, අගුලු දැමීම්, වාහන තදබදය, සිවිල් අරගල, දේශීය හෝ විදේශීය රාජ්‍යයන්ගේ හෝ වෙනත් අධිකාරීන් ක්‍රියා (නීතිප්‍රකාර හෝ තත්වාකාර), කිසියම් නීතියක හෝ නියාමනයක අවශ්‍යතා, වෙළඳපල බාධාවන් හෝ නිෂ්කාශනය කිරීමේ, නිරාකරණය කිරීමේ ආයතනයක හෝ මධ්‍යම තැන්පතු වැනි ඕනෑම ක්‍රියාවක් ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවී අනුපාතික බලපෑම හේතුවෙන් කිසියම් ක්‍රියාවක් කිරීමට බැංකුවට ඇති නොහැකියාව නිසා සිදුවන පාඩු සම්බන්ධයෙන් බැංකුව වගකිව යුතු නොවන්නේ ය.

## 24. තොරතුරු සහ නිවේදන

ගනුදෙනුකරුගේ නම, සම්බන්ධතා තොරතුරු (ජංගම දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළුව), ලිපිනය සහ බැංකුවේ ලියාපදිංචි කර ඇති අනෙකුත් තොරතුරුවල සිදුවන වෙනස්වීම් ලිඛිතව ප්‍රමාදයකින් තොරව ගනුදෙනුකරු විසින් බැංකුවට දැනුම් දිය යුතු වන්නේ ය.

ගනුදෙනුකරුගේ වෙළඳාම, ව්‍යාපාරය හෝ රැකියාව සහ මූල්‍ය තත්ත්වය හෝ ඊට අදාළ කිසියම් වැදගත් වෙනසක් සම්බන්ධයෙන් වන සියලු තොරතුරු ගනුදෙනුකරු විසින් බැංකුව වෙත ලබා දිය යුතු වන්නේ ය.

ගනුදෙනුකරුගේ මූල්‍ය තත්ත්වයට බලපෑම් ඇති කළ හැකි වන්නා වූ ඕනෑම නඩු කටයුත්තක් හෝ නඩු කටයුත්තක් පිළිබඳ තර්ජනය කිරීම් පිළිබඳ විස්තර ගනුදෙනුකරු විසින් බැංකුවට හෙළි කළ යුතු වන්නේ ය.

ගනුදෙනුකරු විසින් ගෙවීමට නියමිත බැංකුවේ පොලී අනුපාත, ගාස්තු, අය කිරීම් සහ කොමිස් මුදල් සම්බන්ධයෙන් වන තොරතුරු බැංකුවේ අයක්‍රම පත්‍රිකාවේ අඩංගු විය යුතු අතර, එය ගනුදෙනුකරුවන් වෙත ඇති ඕනෑම විශේෂ ප්‍රතිලාභයන් ද සමඟ පරිශීලනය සඳහා ආයතනික වෙබ් අඩවියේ දක්වා ඇත.

අන්‍යාකාරයකින් එකඟ නොවන්නේ නම් මිස, පොලී අනුපාත, ගාස්තු, අය කිරීම්, කොමිස් මුදල්, විශේෂ ප්‍රතිලාභ, නිෂ්පාදන ආශ්‍රිත වෙනස්කම් (නියමයන් සහ කොන්දේසි ඇතුළුව), මෙම නියමයන් සහ කොන්දේසිවල සංශෝධන සහ ගනුදෙනුකරුවන් වෙත ලබා දීමට අවශ්‍ය වන්නා වූ වෙනත් දැනුම්දීම් සම්බන්ධ දැන්වීම් ලිඛිතව (පත්‍රිකා සහ/හෝ බැංකුවේ ආයතනික වෙබ් අඩවිය ඇතුළුව විද්‍යුත් සන්නිවේදන නාලිකා) සහ/හෝ බැංකුව විසින් සුදුසු යැයි සලකන අන්‍යාකාරයකින් සැපයිය යුතු වන්නේ ය.

ඉහත සඳහන් ආකාරයෙන් සපයා ඇති නිවේදන පහත පරිදි බලාත්මක විය යුතු වන්නේ ය.

තැපෑලෙන් එවනු ලබන්නේ නම්, තැපැල් කිරීමෙන් අනතුරුව දින දෙකකින් (02)

විද්‍යුත් තැපෑල මගින්, කෙටි පණිවුඩ සේවාව ("SMS") සහ/හෝ වෙනත් විද්‍යුත් ආකාරයකින් සම්ප්‍රේෂණය කිරීම මගින් යවනු ලබන්නේ නම්, බැංකුවට භාරදීම අසාර්ථක බවට වන දැනුම්දීමක් නොලැබුණහොත්, එය වෙනත් ආකාරයකින් සන්නිවේදනය කරනු ඇත; සහ

දිනපතා පුවත්පත්වල, බැංකු ශාඛාවල, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවල හෝ බැංකුවේ ආයතනික වෙබ් අඩවියේ ප්‍රසිද්ධ නිවේදන ලෙස දැනුම්දීම් සිදු කළ හැක. එවැනි අවස්ථාවන්හි දී, ඒවා ප්‍රකාශනය කරන හෝ පළ කරන අවස්ථාවේ දී හෝ බැංකුව විසින් සන්නිවේදනයේ දී සඳහන් කරන වෙනත් අවස්ථාවකදී ක්‍රියාත්මක වේ.

ඉහත සඳහන් ආකාරයෙන් යවන ලද දැන්වීම ප්‍රමාණවත් සහ නිසි දැනුම්දීමක් ලෙස සැළකිය යුතු අතර එය ගනුදෙනුකරු වෙත බැඳී පැවතිය යුත්තේ

ය.

ගනුදෙනුකරුවෙකු විසින් යාවත්කාලීන සම්බන්ධතා තොරතුරු බැංකුව වෙත ලබා නොදෙන්නේ නම්, දැනුම්දීම් නොලැබීම නිසා උද්ගත වන ඕනෑම අලාභයක් ගනුදෙනුකරු විසින් දරනු ඇත. බැංකුව වෙත අවසන් වරට දැනුම් දුන් ලිපිනයට/සම්බන්ධ කර ගත හැකි තොරතුරු මගින් තවදුරටත් ගනුදෙනුකරු වෙත ළඟා විය නොහැකි බවට බැංකුව සාධාරණ ලෙස විශ්වාස කරන්නේ නම් බැංකුව විසින් දැන්වීම් යැවීම අත්හිටුවීමට හෝ නැවැත්වීම කළ හැකි වේ. එවැනි අවස්ථාවක, ගනුදෙනුකරු දැනුම්දීමේ සියලු අවශ්‍යතා අත්හැර දමයි.

**25. විද්‍යුත් බැංකුකරණ සේවාවන්**

25.1. මාර්ගගත බැංකුකරණය, ජංගම බැංකුකරණය සහ විද්‍යුත් ක්‍රමවේදයන් හරහා යවන ලද/සපයා ඇති ගිණුම් ප්‍රකාශයන් වැනි විද්‍යුත් බැංකුකරණ සේවා, සේවාවන්ට/පහසුකම්වලට අදාළ නිශ්චිත නියමයන් සහ කොන්දේසිවලට යටත් විය යුත්තේය.

**26. පාලනය වන නීතිය**

**26.1. අධිකරණ බලය පවතින ස්ථානය**

වෙනත් ඕනෑම රටක හෝ වෙනත් ඕනෑම අධිකරණයක ගනුදෙනුකරුට එරෙහිව ක්‍රියා කිරීමට බැංකුවට ඇති අයිතියට අගතියක් නොවන පරිදි, ශ්‍රී ලංකාවේ අධිකරණයේ අනන්‍ය නොවූ අධිකරණ බලයට අවලංගු කළ නොහැකි වන ලෙසට ගනුදෙනුකරු යටත් වේ. (බැංකුවට එරෙහිව ද නඩු පැවරිය හැක්කේ ශ්‍රී ලංකා අධිකරණය ඉදිරියේ පමණි).

හරයාත්මක නීතිය

මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නීතිය මගින් පාලනය විය යුත්තේ ය.

**නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී.**
PQ 118,
යූනියන් පෙදෙස, කොළඹ 2

**අවසාන සමාලෝචනය: ජූනි 2024**